# මධ්‍යම සංස්කෘතික අරමුදල

## දැක්ම

"ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් ගෝලීය ආශ්චර්යය බවට පත් කිරීම"

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් පර්යේෂණය, ආරක්ෂණය, සංරක්ෂණය, සංවර්ධනය, ප්‍රවර්ධනය හා

තිරසාර සංස්කෘතික ආර්ථික සාධනය මගින්

"පෙරදිග සංස්කෘතික උරුම කළමනාකරණය"

පිළිබඳ

විශිෂ්ඨත ම ආයතනය වීම.

## මධ්‍යම සංස්කෘතික අරමුදල කාර්යයන් හා පරමාර්ථ

- සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සංස්කෘතික ස්මාරක සහ සංස්කෘතික ත්‍රිකෝණය හැර වෙනත් යම් ප්‍රදේශයක ඇති මහජන යහපත සඳහා දියුණු කිරීම අවශ්‍ය බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන වෙනත් යම් සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී වන වියදම් දැරීම.
- ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි සහ වෙනත් ඒ හා සමාන යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් දැරීම.
- ශ්‍රී ලංකාව ඇතුළත හෝ විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.
- ආගම නංවාලීම, ආගමික ස්ථාන හෝ ආගමික වත් පිළිවෙත් පවත්වා ගෙන යාම සඳහා ආධාර ලබා දීම.
- සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්ගෙන් ජාතියට සේවය කර ඇති අය සඳහා ප්‍රදානයන් පිරිනැමීම.
- කලාකරුවන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට, මූර්ති ශිල්පීන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා නිරත වෙනත් තැනැත්තන්ට ආධාර සැලසීම.
- මණ්ඩලයේ මතය අනුව මහජනයාට ප්‍රතිලාභයක් හෝ යහපතක් සැලසෙන වෙනත් යම් ආගමික හෝ සංස්කෘතික කාර්යයන්ට ආධාර ලබා දීම.

# මධ්‍යම සංස්කෘතික අරමුදලේ තිස් එක්වන වාර්ෂික වාර්තාව - 2013

## පාලක මණ්ඩලය

### 2013 වර්ෂයට අදාළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලය

**පාලක මණ්ඩලයේ සභාපති**
අග්‍රාමාත්‍ය ගරු දි.මු. ජයරත්න මැතිතුමා

ගරු ටී.බී. ඒකනායක මැතිතුමා
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා

ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා
නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා
අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු දි.මු. ජයරත්න මැතිතුමා
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා

එස්. අමරසේකර මැතිතුමා
අග්‍රාමාත්‍ය ලේකම්තුමා

වසන්ත ඒකනායක මහතා
ලේකම්
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

ආචාර්ය සෙනරත් දිසානායක මහතා
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමා
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා

ඩබ්. ඒ. රණවීර මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
මධ්‍යම සංස්කෘතික අරමුදල

**ආරාධිත භවත්හු**

එන්. ගොඩකන්ද මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (2013 අප්‍රේල් 10 දින දක්වා)

නාලිනී අමරතුංග මහත්මිය
අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (2013 ජුනි 19 දිනට)

ජී.ඩී.සී. ඒකනායක මෙනවිය
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩල හා කාර්යය මණ්ඩල ප්‍රතිපත්ති සහ ආයතන කමිටු රැස්වීම් 2013 වර්ෂය තුළ දී ද පවත්වන ලද අතර, මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යයන්ට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා අවශ්‍ය මාර්ගෝපදේශයන් පාලක මණ්ඩලය විසින් තීරණය කර එකී උපදෙස් හා නියමයන්ට අනුව අදාළ කාර්යයන් ක්‍රියාත්මක කර ඇත.

# මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය - 2013

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතට අනුව සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යංශයේ ලේකම්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරී වශයෙන් කටයුතු කරනු ලබයි. ආයතන ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරනු ලබන අතර, මධ්‍යම සංස්කෘතික අරමුදලේ සමස්ත කාර්යභාරය සංවර්ධන, පාලන සහ මුදල් වශයෙන් ප්‍රධාන අංශ තුනක් යටතේ හා විෂයභාර අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ මෙහෙයවීමෙන් සිදුකරගෙන යනු ලබයි.

මෙම කාර්යභාරය ඉටුකරගෙන යාම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය මෙම වසර තුළ දී සේවයේ යොදවා ගන්නා ලදී.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් | 02 |
| තෘතියික කළමනාකරණ මට්ටමේ නිලධාරීන් | 23 |
| ද්විතියික නිලධාරීන් | 337 |
| ප්‍රාථමික නිලධාරීන් | 1626 |
| | 1988 |

## සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

ගරු ටී.බී. ඒකනායක මැතිතුමා

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා

## මධ්‍යම සංස්කෘතික අරමුදල - 2013
## ප්‍රධාන කළමනාකරණ මට්ටමේ නිලධාරීන්

**ප්‍රධාන පරිපාලන නිලධාරි**
වසන්ත ඒකනායක මහතා
ලේකම්
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

**අධ්‍යක්ෂ ජනරාල්**
ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යාඥ මහාචාර්ය ගාමිණී අදිකාරී මහතා

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**
ඩබ්.ඒ. රණවීර මහතා

**අධ්‍යක්ෂ (මුදල්)**
ඩබ්.පී. සරත් මහතා

**අධ්‍යක්ෂ (සංවර්ධන)**
පී.එම්.ජී. මල්දෙණිය මහත්මිය

**සහකාර අධ්‍යක්ෂ (පාලන)**
පුරාවිද්‍යාඥ ගාමිණී දොඩම්වල මහතා

# 2013 වසරේ භෞතික ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ඇති පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය කර අනාගත පරපුර වෙනුවෙන් රැක ගැනීම අරමුණු කර ගනිමින් මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ආරම්භ කොට දැනට පවත්වාගෙන යන ව්‍යාපෘති පහත දැක්වෙන අතර එයින් අභයගිරිය හා ජේතවනය ස්තූප සංරක්ෂණය දැනට අවසන් කර ඇති විශාල වියදමක් දැරූ ව්‍යාපෘති වේ.

- අභයගිරිය
- ජේතවනය
- සීගිරිය
- පොළොන්නරුව
- මහනුවර
- තිස්සමහාරාමය
- ගාල්ල
- රම්බාවිහාරය
- දඹුල්ල
- වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘතිය (යාපහුව, දඹදෙණිය, පඬුවස්නුවර, කුරුණෑගල)
- රුහුණු සංස්කෘතික කලාපය

ඒ අනුව 2013 වර්ෂය සඳහා කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ කාර්යයන් 88 ක් ද සංරක්ෂණ වැඩබිම් 193 ක් ද වශයෙන් වැඩබිම් 281 ක් යෝජනා වී තිබුණි. මින් 243 ක වැඩ ආරම්භ කිරීමට හැකි වූ අතර, එයින් 27 ක වැඩ නිම කිරීමට හැකි විය (කැණීම් 11, සංරක්ෂණ 16).

වර්ෂය තුළ දී වැඩ ඒකක 147,415.21 ක් අවසන් කර ඇති අතර ඒ අනුව භෞතික ප්‍රගතිය 86.39% කි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා සෘජු වියදම් වශයෙන් රුපියල් 434,518,000.23 ක් වැය කළ අතර, සෘජු වියදම් වල මූල්‍යමය ප්‍රගතිය 67.34% කි.

ඒ ඒ ව්‍යාපෘතිවල සංක්ෂිප්ත විස්තර පහතින් දක්වා ඇත.

# ජේතවන ව්‍යාපෘතිය

## කැණීම් අංශය

මෙම වසරේ දී මොනර මාළිගය කැණීම, JSOWMP 2013 පර්යේෂණ කැණීම, පුරාවස්තු වර්ගීකරණය හා විශ්ලේෂණය, පුරාවිද්‍යා පර්යේෂණ වාර්තා සකස් කිරීම හා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදී.

ජේතවන ව්‍යාපෘතියේ පිහිටි අලංකාර ගොඩනැගිල්ලක් වූ මොනර මාළිගයේ කැණීම් කටයුතු මෙම වසරේ දී ආරම්භ කළ ප්‍රධානතම කැණීම් කාර්යය වේ. මෙම කැණීම මගින් ගොඩනැගිල්ලේ පැරණි බැම්වල කොටස් හා පාදම්ගල් මතුකර ගැනීමට ත් දොරටුවේ ශේෂයන් මතුකර ගැනීමට ත් හැකි විය.

එසේම ජේතවන ස්තූපයේ බටහිර ප්‍රවේශ දොරටුවට දකුණු පසින් ($N_1$ $W_4$) සිදු කරන ලද පර්යේෂණ කැණීම JSOWMP-2013 නමින් හඳුන්වන ලදී. මෙම කැණීම තුළින් අනුරපුර යුගයට පෙර යුගයේ වටිනා පුරාවිද්‍යාත්මක සාධක රැසක් හමු වූ අතර එසේ හමු වූ අඟුරු සාම්පල කාලනීර්ණය සඳහා ඇමරිකාවේ බීටා ආයතනයට යවන ලදී.

එසේම පුරාවස්තු වර්ගීකරණය හා විශ්ලේෂණය යටතේ පබළු අධ්‍යයනය, මැටි බඳුන් අධ්‍යයනය, පාෂාණ අධ්‍යයනය හා ලෝහ වර්ග අධ්‍යයනය යන කාර්යයන් සිදු විය.

**කැණීම් අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.**




මොනර මාළිගය කැණීමට පෙර අවස්ථාව සහ කැණීමට පසු අවස්ථාව



(JSOWMP-2013 කැණීම ආරම්භ කිරීමට පෙර සහ කැණීම් භූමිය සකසා ගැනීමෙන් පසු)



(JSOWMP-2013 කැණීම ආරම්භ කළ පසු සහ පස් සාම්පල් ලබා ගන්නා අයුරු)



(JSOWMP-2013 කැණීම් භූමියෙන් හමු වූ විශේෂ පුරාවස්තු)

## සංරක්ෂණ අංශය

අභයගිරිය සංරක්ෂණ අංශය මගින් මෙම වර්ෂයට අදාළ ව මොනර මාළිගය සංරක්‍ෂණය, 'කේ' නමින් හඳුන්වන ආරාමයේ ඉතිරි වැඩ, ස්තූපයේ පැරණි බදාම සංරක්‍ෂණය, ශ්‍රී මහා බෝධිප්‍රාකාර බැම්ම සංරක්‍ෂණය, තිඹිරි පොකුණ සංරක්‍ෂණය සඳහා යෝජිත වැඩපිළිවෙල සකස් කිරීම, ස්ථිර රථගාල ඉදිකිරීම, භූ දර්ශන හා උද්‍යාන නඩත්තු කටයුතු ආදී කාර්යයන් සිදු කරනු ලැබීය.

ජේතවන භූමියට අයත් කැටයම් සහිත කුළුණු හිස්වලින් යුත් විශේෂිත ගොඩනැගිල්ලක් වූ මොනර මාළිගයේ සංරක්‍ෂණ කටයුතු 2013 ජනවාරි මස සිට සිදු කිරීමට යෝජනා වුව ද එම කටයුතු අරම්භ කළ හැකි වූයේ මෙම වසරේ සැප්තැම්බර් මසදී ය.

භූ දර්ශන හා උද්‍යාන නඩත්තු යටතේ යන්ත්‍රානුසාරයෙන් වල් කැපීම, ගොඩනැගිලි වටා සීමා සලකුණු (බෝඩර්) කැපීම හා ජේතවන භූමියේ අනෙකුත් නඩත්තු කටයුතු ආදිය ක්‍රමානුකූල ව සිදු කර දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය වර්ධනය වන ආකාරයට ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

භික්‍ෂූන් වහන්සේගේ ආවාස කුටි ලෙස භාවිත කෙරෙන පංචාවාස ගොඩනැගිලි සංකීර්ණයට අයත් ව පිහිටා ඇති " K " නමින් හැඳින්වෙන ආරාම ගොඩනැගිල්ලෙහි ප්‍රාකාර බැම්ම සංරක්‍ෂණය කිරීම ද මෙම වසරේ දී සිදු විය.

ස්තූපයෙහි විනාශ වී ඇති ස්ථාන පැරණි බදාමයට ගැළපෙන අයුරින් සකස් කළ විශේෂිත වූ බදාම මිශ්‍රනයක් යොදා ගනිමින් සංරක්‍ෂණය කිරීම ද මෙම වසරේ දී සිදුකළ වැදගත් සංරක්ෂණ කාර්යයන් අතර වේ.

2003 වසරේ දී සංරක්ෂණය කළ ශ්‍රී මහා බෝධි ප්‍රාකාරය ස්වාභාවික හේතූන් මත විනාශ ව ගොස් තිබූ හෙයින් මෙම වසරේ දී නැවත සංරක්ෂණය කිරීමට යෝජිත විය. ඒ අනුව, විද්‍යාත්මක සංරක්ෂණ ක්‍රමවේදයන්ට අනුකූලව පෙර තිබූ ආකාරයට මෙම බැම්ම නැවත සංරක්‍ෂණ කරන ලදී.

වසර පුරාවටම භූ දර්ශන හා උද්‍යාන නඩත්තු කටයුතු ආදිය ද අඛණ්ඩව ඉතා ක්‍රමවත් ලෙස සිදු විය.

**සංරක්ෂණ කටයුතු වලට අදාළ ඡායාරූප**



(මොනර මාළිගයේ සංරක්ෂණ කටයුතු සිදු වන අතරතුර)



(මොනර මාළිගයේ සංරක්ෂණ කටයුතු සිදු වන අතරතුර)



කේ. නමින් හැඳින්වෙන ආරාමය සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණ කටයුතු සිදු වන අතරතුර



(ශ්‍රී මහා බෝධියෙහි බැම්ම සංරක්ෂණය ආරමභ කිරීමට පෙර
සහ සංරක්ෂණ කටයුතු සිදු කරගෙන යන අතරතුර)

# අභයගිරිය ව්‍යාපෘතිය

## කැණීම් අංශය

අභයගිරිය ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේ දී සිදු කළ කැණීම් සම්බන්ධ විස්තර පහත සඳහන් කර ඇත.

- ථූපාරාම පුරාණ පෙත්මග කැණීම් කිරීම
- රුවන්වැලිසෑය නැගෙනහිර ප්‍රකාරය කැණීම
- රුවන්වැලිසෑයට නැගෙනහිරින් පිහිටි අංක 2 ගොඩනැගිල්ල කැණීම
- රුවන්වැලිසෑයේ පිටත ප්‍රාකාරයෙන් පිටත පිහිටි භූමියේ නැගෙනහිර සීමාව කැණීම
- අභයගිරි විහාර භූමියේ මෙගලිතික සුසාන කැණීම
- 2013 වර්ෂයේ කැණීම් සම්බන්ධ වාර්තා සකස් කිරීම

ඒ අනුව මහාවිහාර භූමි සීමාව තුළ පිහිටි ථූපාරාම පුරාණ පෙත්මග පාදා ගැනීමේ අරමුණින් සිදු කළ කැණීම මෙම වසරේ ජනවාරි මස සිට මැයි මස දක්වා ක්‍රියාත්මක විය. කැණීම් අවසානයේ මෙම පෙත්මග සංරක්ෂණය සඳහා කටයුතු කරන ලදී.

රුවන්වැලිසෑයෙහි සීමා ප්‍රාකාරය කැණීම් කර සම්පූර්ණයෙන් පාදා සංරක්ෂණය කරන ලදී. එසේම අභයගිරි භූමියේ පිහිටි මෙගලිතික සුසාන භූමියක් ද මෙම වසරේ කැණීම් කිරීමට හැකි විය.

ඒ අනුව සියලු කැණීම් අවසානයේ වාර්ෂික කැණීම් වාර්තා සකස් කිරීම ද වසර පුරාවටම ක්‍රියාත්මක කරන ලදී.

## සංරක්ෂණ අංශය

අභයගිරි සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ මෙම වසර තුළ පහත සඳහන් සංරක්ෂණ, නඩත්තු හා අලුත්වැඩියා සිදු කරන ලදී.

- ලංකාරාමය ගොඩනැගිල්ල සංරක්ෂණය
- සඳකඩපහණ අසළ පෙත්මග සංරක්ෂණය
- ථූපාරාම බෝධිඝරය සංරක්ෂණය
- ථූපාරාම පිට ප්‍රාකාරය සංරක්ෂණය
- අභයගිරි ස්තූප සංරක්ෂණය
- රුවන්වැලිසෑය අංක 04 ගොඩනැගිල්ල සංරක්ෂණය
- රුවන්වැලිසෑය රෝහල සංරක්ෂණය
- ථූපාරාම රෝහල සංරක්ෂණ
- කෞතුකාගාර වහල අළුත්වැඩියාව
- පොත් අළෙවි සැල අළුත්වැඩියාව
- අභයගිරි විහාරයේ ත්‍රිමාණ සැලසුම සකස් කිරීම
- පර්යේෂණ හා ප්‍රකාශන
- විද්‍යාත්මක නඩත්තු
- සාමාන්‍ය නඩත්තු
- අභයගිරි ස්තූප නඩත්තු
- කෞතුකාගාර වැසිකිළිය නවීකරණය
- වාහන සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම
- කොම්පෝස්ට් නිෂ්පාදනාගාරයේ වහලය ඉදිකිරීම
- රසායනාගාරය නවීකරණය
- රුවන්වැලි සෑය ජල මාර්ගය සකස්කිරීම
- අධ්‍යක්ෂ නිල නිවසේ වැසිකිළිය අළුත්වැඩියාව
- කාර්යාලය අළුත්වැඩියාව

ඒ අනුව සංඝාවාස ගොඩනැගිල්ලක් යැයි විශ්වාස කෙරෙන ලංකාරාමය ගංවතුරට යටවීම නිසා ඒ දක්වා සංරක්ෂණය කර තිබූ සියලුම කොටස් විනාශ වී ගිය බැවින් එම සංරක්ෂණ කටයුතු අලුතින්ම ආරම්භ කිරීමට සිදු වීමෙන් වැඩ ප්‍රමාණය හා ඇස්තමේන්තුගත මුදල මුල් ඇස්තමේන්තුව ඉක්මවා යනු ලැබීය. එසේම ථූපාරාම විහාර භූමිය වටා ඇති දිග මීටර් 500 ක් සහ උස මීටර් 1.5 ක් වන ප්‍රාකාරය සංරක්ෂණ කිරීම ද මීට සමගාමීව සිදු කරනු ලැබීය.

පසුගිය වසර තුළ සිදු කළ අභයගිරි ස්තූපයේ සලපතල මළුව හා ගර්භය සංරක්ෂණය කිරීමෙහි අවසන් අදියර මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී. එසේම රුවන්වැලිසෑයෙහි නැගෙනහිර ප්‍රවේශ දෙරටුව අසළ පිහිටි ස්මාරකයක් වන 'රෝහල' නමින් හැඳින්වෙන ගොඩනැගිල්ල මෙම වර්ෂයේ සංරක්ෂණයට යෝජිත වුව ද අපේක්ෂිත කාලයට කාර්ය ආරම්භ කර ගැනීමට නොහැකි වීම නිසා මීළඟ වර්ෂයේ සැලසුම් වලට ඇතුළත් කරන ලදී.

එසේම අභයගිරි විහාරාධිකාරී හිමිගේ ඉල්ලීම පරිදි විහාරයේ සැලසුමක් ඇඳීම ද සංරක්ෂණ අංශයෙන් සිදුවූ තවත් වැදගත් කරුණක් ලෙස පෙන්වාදිය හැකිය. සංරක්ෂණ වාර්තා සකස් කිරීමේ දී 2003 හා 2004 වර්ෂ වල සංරක්ෂණ වාර්තා සකස් කර මුද්‍රණයට සූදානම් කිරීම ද සිදු විය.

අභයගිරි විහාර භූමියෙහි පසුගිය කාල සීමාව තුළ සංරක්ෂණය කරන ලද ස්මාරක හායනයට ලක් වී ඇති බැවින් ඒවා නැවත සකස් කිරීමේ කටයුතු මෙම වසරේ දී සිදු කරන ලදී. මේ යටතේ ස්මාරක සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීම හා ගොඩනැගිලි නඩත්තු කිරීම ආදී කටයුතු සිදු විය. එසේම අභයගිරිය ස්තූපය සංරක්ෂණ ක්‍රියාවලිය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය මත එහි කුස්තුර පිරවීම, වල් පැලෑටි ගැලවීම හා වැලි මළුව පිරිසිදු කිරීම යනාදී කාර්යයන් සිදු කරන ලදී.

සංචාරක පොදු පහසුකම් වර්ධනය කිරීම යටතේ යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ක්‍රියාමාර්ග ගැනීම, කොම්පෝස්ට් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම හා අනුරාධපුර රසායනාගාරයේ අලුත්වැඩියා කටයුතු ද අභයගිරිය කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු ද සිදු කිරීම මෙම වසරේ දී ඉටු කරන ලද අනෙකුත් කාර්යයන් අතර වේ.

# පොළොන්නරුව ව්‍යාපෘතිය

## කැණීම් අංශය

මෙම වර්ෂය තුළ ඇතුළුනුවර දකුණු ප්‍රාකාර බැම්ම කැණීම අදියර දෙකක් යටතේ සිදු කරනු ලැබීය. ඒ අනුව පළමු අදියරේ දී සම්පූර්ණ බැම්මෙන් මීටර 100 ක ප්‍රමාණයක් කැණීම් මගින් පාදා ගත් අතර දෙවන අදියර යටතේ මීටර 112 ක ප්‍රමාණයක් කැණීම් සිදු කරන ලදී.

එසේම ශාස්ත්‍රීය දේශන 10 ක් පැවැත්වීම, ශිෂ්‍ය පුහුණු වැඩසටහන යටතේ කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා විශේෂවේදී ප්‍රථම වසර සිසුන් 23 දෙනෙකුට ක්ෂේත්‍ර පුහුණුව ලබා දීම හා වාර්ෂික පුරාවිද්‍යා සම්මන්ත්‍රණයක් පැවැත්වීම යන කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී. එසේම පුරාවස්තු රසායනාගාරයේ ක්‍රියාකාරකම් ද මාස හයක කාලයක් අඛණ්ඩව සිදු විය.

**කැණීම් අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**



අතුල් නුවර දකුණු ප්‍රාකාරය පළමු අදියර කැණීමට පසු



අතුල් නුවර දකුණු ප්‍රාකාරය දෙවන අදියර කැණීමට පසු

## සංරක්ෂණ අංශය

මේ යටතේ ලංකාතිලක පිළිමගෙය, නැගෙනහිර වෙහෙර, ඇතුල් නුවර දකුණු ප්‍රාකාර බැම්ම, ඇතුළු නුවර නැගෙනහිර ප්‍රාකාර බැම්ම, ඇතුළු නුවර උතුරු දොරටුවේ බටහිර කොටස යන පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය හා විද්‍යාත්මක නඩත්තු කිහිපයක් සිදු කරන ලදී.

ලංකාතිලක පිළිමගෙයි දකුණු පස බිත්තිය සංරක්ෂණය කළ අතර එහිදී විශාල වශයෙන් කුස්තුර පිරවීම් සිදු කරන ලදී. මැයි සිට සැප්තැම්බර් දක්වා මෙම සංරක්ෂණ කාර්යය සිදු විය.

කැණීම් මගින් මතුකරගත් ශිවදේවාල අංක 02 අසළ පිහිටි වාස්තුවිද්‍යාත්මක ගොඩනැගිල්ල ස්තූපයක් බවට තහවුරු කරගත් පසු සංරක්ෂණය කිරීම ආරම්භ විය. ඒ අනුව ස්තූපයේ වාස්තුවිද්‍යාත්මක අංග ආරක්ෂා කර ගැනීම සඳහා සංරක්ෂණය කළ අතර මෙහිදී ගර්භය ආශ්‍රිත කොටස් ද හමු වූ සාධක මත පදනම්ව සංරක්ෂණය කරන ලදී.

ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විශාල වශයෙන් හායනය වී ඇති ඇතුළුනුවර දකුණු ප්‍රාකාර බැම්ම කැණීම් මගින් පාදා ගත් පසු සංරක්ෂණය කරන ලද අතර එයට සමගාමීව ඇතුළු නුවර නැගෙනහිර ප්‍රාකාර බැම්ම ද සංරක්ෂණය කරන ලදී.

එසේම විද්‍යාත්මක නඩත්තු යටතේ ආලාහන පරිවෙන හා රෝහල කොටසේ බැම් සංරක්ෂණය, විජයබාහු මාළිගය සංරක්ෂණය, කිරි වෙහෙරෙහි හුණු ආලේපය, පුරාවිද්‍යාත්මක ස්මාරක වෙත ළඟා වීමට පෙත් මං ඉදි කිරීම, ගල් විහාරය නඩත්තු කිරීම හා ආවාස ගෙය ඉදි කිරීම හා සංරක්ෂණ වාර්තා සකස් කිරීම ආදී කාර්යයන් ද මෙම වර්ෂය තුළ සිදු කරන ලදී.

### වර්ෂයට අදාළ සංරක්ෂණ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්





ලංකාතිලක පිළිමගෙය සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයට පසු





නැගෙනහිර වෙහෙර සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයට පසු



කිරි වෙහෙර හුණු ආලේපයට පසු



ආවාසගෙය ඉදි කිරීමෙන් පසු

# සීගිරිය ව්‍යාපෘතිය

## කැණීම් අංශය

සීගිරි භූමි සැලැස්මේ ඇතුළු දිය අගලෙහි දකුණු හා බටහිර අන්තය පූර්ණ වශයෙන් සංරක්ෂණය කර තිබුණ ද උතුරු අන්තය සංරක්ෂණය කොට නොමැත. එබැවින් ඇතුළු දිය අගලෙහි උතුරු දොරටුවේ සිට වාන දක්වා වූ කොටස සංරක්ෂණය කිරීම සඳහා මෙම වසරේ දී කැණීම් කටයුතු සිදු කරන ලදී.

මීට අමතර ව සීගිරිය හා තදාශ්‍රිත ප්‍රදේශවල පිහිටි පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි දත්ත වාර්තා කිරීමේ පරමාර්ථයෙන් ලෙන් සහිත භූමියක් වූ නාගොල්ල මාගල්ලෙන ප්‍රදේශය ගවේෂණය ද මෙම වසරේ දී සිදු විය. මෙම ගවේෂණයේ දී කටාරම් කොටන ලද, බ්‍රාහ්මී ලිපි සහිත ලෙන් 12 ක්, නිධන් හොරුන් විනාශ කරන ලද පැරණි ස්මාරක සහිත ස්ථාන 15 ක් හා පුරාවිද්‍යාත්මක අවශේෂ සහිත ස්ථාන 03 ක් සොයා ගන්නා ලදී.

මීට අමතරව කැණීම් වාර්තා මුද්‍රණය සඳහා සකස් කිරීම, පුරාවස්තු විශ්ලේෂණය හා දත්ත ගබඩා සකස් කිරීම, පුරාවස්තු සංරක්ෂණය හා මැටි බඳුන් විශ්ලේෂණය යන කාර්යයන් ද මෙම වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

කෞතුකාගාරයේ විශේෂ ප්‍රදර්ශන, ලේඛනාගාරය, මැදිරි සහ පුරාවස්තු දත්ත නිරන්තර නියාමනය හා දෛනික නඩත්තුව ද සිදු කෙරිණි.

**කැණීම් අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප**



(කැණීමට ප්‍රථම භූමිය දිස්වන අයුරු)



(වර්ෂය අවසානයේ දී කැණීම් භූමිය දිස්වන අයුරු)



(පර්යේෂණ අගල 01)




(කැණීම් කටයුතු අතරතුර ගල්වරි මතුකර ගත් අවස්ථාවක්)

## සංරක්ෂණ අංශය

පසුගිය වසරේ මුල් කාර්තුවේ දී ආරම්භ කර අත්හිටුවනු ලැබූ සිංහපාදය බටහිර බැවුමෙහි සංරක්ෂණ කටයුතු, සිංහපාදය මළුව නැගෙනහිර කොටස, විද්‍යාත්මක බැම් සංරක්ෂණය, ගල මුදුන දකුණු අන්තය සංරක්ෂණය කිරීම, මොරගහමුල නඩත්තු කටයුතු, පැරණි කාර්යාලය සංරක්ෂණය කිරීම, ගොඩනැගිලි කිහිපයක් නඩත්තු කිරීම හා මාර්ග නඩත්තු කිරීම් ආදී සංරක්ෂණ හා නඩත්තු කටයුතු රාශියක් මෙම වසරේ දී සිදු කරනු ලැබීය.

ඒ අනුව පසුගිය වසරෙහි මුල් මාස කිහිපය තුළ ආරම්භ කළ සිංහපාදය බටහිර ආරක්ෂිත බැම්මෙහි සංරක්ෂණ කටයුතු වර්ෂාවෙන් එල්ල වූ බාධා හේතුවෙන් අත්හිටුවනු ලැබීය. එය මෙම වසරේ දී නැවත ආරම්භ කර හුණු, සිමෙන්ති හා වැලි බදාම මිශ්‍රනය භාවිතයෙන් සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී.

සිංහපාදය මළුවෙහි නැගෙනහිර පිහිටි ගරා වැටුණු ගඩොල් බැම් සංරක්ෂණය කිරීම සිදු කරනු ලැබීය.

එසේම ක්ෂුද්‍ර ජල උද්‍යානය හා මාලක උද්‍යානය ආශ්‍රිතව සිදුවූ මානව හා ස්වාභාවික ක්‍රියාකාරකම් හේතුවෙන් ගැලවී ඇති බැම් ආදිය පැරණි ගඩොල් යොදා සංරක්ෂණය සිදු කරන ලදී.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කරන ලදුව මේ වන විට විවිධ කාලගුණික ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වී ගොස් තිබූ සීගිරිය මාළිගා සංකීර්ණයේ බටහිර බෑවුම් පෙදෙසේ පිහිටි බැම් ආදිය මෙම වසරේ දී සංරක්ෂණය කිරීමට හැකි විය. මෙහිදී පූර්ව ස්වභාවයට හානි නොවන පරිදි සුදුසුම ගඩොල් හා බදාම භාවිත කරමින් සංරක්ෂණ කාර්යය සිදු කරන ලදී.
සීගිරිය සංචාරක වෙළඳසැල් පවතින මොරගහමුල ප්‍රදේශයේ සංචාරක ආකර්ශනය වැඩි දියුණු කිරීම සඳහා උද්‍යාන අලංකාර කිරීම සිදු විය.

සීගිරිය නව පුරාවිද්‍යා කෞතුකාගාර ගොඩනැගිල්ල ඉදි කිරීම ත් සමග පැරණි ගොඩනැගිල්ල සංරක්‍ෂණය කිරීමට යෝජනා වූ අතර දිරාපත් වූ දොර, ජනෙල්, වහල ආදිය පැරණි ස්වභාවය ආරක්‍ෂා වන අයුරින් සංරක්‍ෂණය කරන ලදී.

ස්වභාවික හේතුන් සහ සංචාරකයින්ගේ පැමිණීම නිසා දුර්වල මට්ටමක පැවති මාර්ග වල පස් කඳු ඉවත් කොට සංචාරක ආකර්ශනය ඇති වන පරිද්දෙන් උද්‍යාන අලංකරණය කිරීම ද සිදු විය.

# දඹුල්ල ව්‍යාපෘතිය

## සංරක්ෂණ අංශය

මේ යටතේ දැඹව ටැම්පිට විහාරය, ඇවරියපතහ ලෙන් විහාරය, මහවැහැර ටැම්පිට විහාරය, මානින්ගමුව පුරාණ විහාරය හා තලකිරියාව ටැම්පිට විහාරය ආදී විහාර වල බිතුසිතුවම් සංරක්ෂණය කරන ලදී.

මෙම වර්ෂය තුළ දඹුල්ල ව්‍යාපෘතිය මගින් ඉටු කළ වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ ක්‍රියාකාරකම් යටතේ වලගම්බා පිරිවෙන මැද පන්සලේ ආවාසගෙය හා පොහොයගෙය, කෞතුකාගාරය හා උයන්වත්ත පන්සල අතර ඇති ආරක්ෂිත බැම්ම සංරක්ෂණය ප්‍රධාන කාර්යයන් වේ.

බිතුසිතුවම් කෞතුකාගාරයේ අභ්‍යන්තර නඩත්තු සිදු කරන ලද අතර මෙහිදී විදුලි පරිපථ පද්ධතිය නිරීක්ෂණය හා අලුත්වැඩියාව ආදිය සිදු කරන ලදී. එසේම සංචාරක ආකර්ෂණය වැඩි කිරීම සඳහා කෞතුකාගාරයෙහි පිටත භූ දර්ශනය ක්‍රමවත් කිරීම හා උද්‍යාන නඩත්තුව යන කාර්යයන් සිදු කරන ලදී.

එසේම කෞතුකාගාර කාර්යමණ්ඩලය විසින් අධ්‍යාපන ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර පාසැල් චිත්‍ර තරඟ හා අධ්‍යාපන සමුළු ආදිය එසේ සිදුවූ වැදගත් කාර්යයන් කිහිපයකි.

**සංරක්ෂණ අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**



දැඹව ටැම්පිට විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය අතරතුර

# මහනුවර ව්‍යාපෘතිය

## කැණීම් අංශය

මෙම වසරේ දී මූලික වශයෙන් බඹරගල පුරාවිද්‍යා ස්ථානයේ කැණීම් කටයුතු ක්‍රියාත්මක කරන ලදී. මීට අමතර ව බඹරගල හා ඒ අවට ප්‍රදේශය ගවේෂණය, කැණීම් හා සංරක්‍ෂණ වාර්තා සකස් කිරීම, පුරාවස්තු විශ්ලේෂණය, අධ්‍යාපන හා ප්‍රචාරණ කටයුතු, මැදවාසල බිසෝ කෞතුකාගාරය සංරක්ෂණය කිරීම් ආදිය සිදු කරන ලදී.

ඒ අනුව බඹරගල පුරාවිද්‍යා ස්ථානයේ මූලික කැණීම් කටයුතු (මීටර් 4×2 ප්‍රමාණයේ) පර්යේෂණ කැණීමක් වශයෙන් සිදු විය.

බඹරගල පුරාවිද්‍යා තදාශ්‍රිතය ගවේෂණය, තෝරාගත් ගුහා 20 ක් පාදක කර ගනිමින් සිදු කරන ලදී. මෙහිදී ;

1. ක්‍ෂේත්‍ර සැලසුම් පිළියෙල කිරීම
2. සෙල්ලිපි පිටපත් කිරීම
3. නියැදි ඒකරාශීකරණය

යන කාර්යයන් සිදු කරන ලදී.

කැණීම් හා සංරක්‍ෂණ වාර්තා සකස් කිරීමේ දී පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කෙරිණි.

1. 2012 වාර්ෂික සංරක්‍ෂණ වාර්තාව පරිගණක ගත කිරීම
2. 2012 වාර්ෂික බිතුසිතුවම් සංරක්‍ෂණ වාර්තාව පරිගණක ගත කිරීම
3. මැණික්හින්න පොත්ගුල් විහාරයේ පුස්කොළ පොත් හා පැරණි ලේඛන ලේඛනගත කිරීම
5. පැරණි ත්‍රිපිටක ග්‍රන්ථ ලේඛණගත කිරීම
6. මලයරට පුනරාවලෝකන ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා ලැබී ඇති ලිපි 18 ක් සංස්කරණය
7. ව්‍යාපෘති පුස්තකාලය සඳහා අවශ්‍ය පොත් පත් මිලදී ගැනීම

## සංරක්ෂණ අංශය

පසුගිය වසරේ අවසාන කාර්තුවේ ආරම්භ කළ කන්දෙපිට ටැම්පිට විහාරය, මැණික්හින්න රජමහා විහාරය හා තුම්පනේ ඉහළ විහාරයෙහි රූඳවුම් බැම්ම සංරක්ෂණය යන කාර්යයන් හි ඉතිරි වූ සංරක්ෂණ කටයුතු සහ මල්වත්ත මහානායක නිල ආරාමය, නාථ දේවාල ආවාසගේ වහළ, , මුලාදෑණි මන්දිරය යන ස්ථානයන් හි සංරක්ෂණ කාර්යයන් සහ ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථානය අළුත්වැඩියාව ද මෙම වසරේ දී සිදු කර අවසාන කරන ලදී.

රාම විහාරය, මල්වතු විහාර සංකීර්ණයේ වහල, වතුපොල පුරාණ විහාරය, පිලවල ගල්ඒදණ්ඩ රජමහා විහාරය හා මැදවාසල බිසෝ කෞතුකාගාරය යන ස්ථානයන්හි සංරක්ෂණ කටයුතු මේ වනවිට සිදුකෙරෙමින් පවතී.

පොතුහැර මඩුගල්ල විහාරය (අස්ගිරි විහාර සංකීර්ණය), අස්ගිරි විහාර සංකීර්ණයේ පිහිටි පුරාණ ළිඳ සහ ගඩලාදෙණිය රජමහා විහාරය යන ස්ථාන මෙම වසරේ දී සංරක්ෂණය සිදු කිරීමට යෝජනා වූ නමුත් ප්‍රමාණවත් සංරක්ෂණ නිලධාරීන් නොවූයෙන් 2014 වර්ෂය සඳහා කල් දමන ලද ව්‍යාපෘතීන් වේ.
බිතුසිතුවම් සංරක්ෂණ අංශයෙන් සිදු වූ කාර්යයන් යටතේ දන්තුරේ රජමහා විහාරය, බඹරගල රජමහා විහාරය, කන්දපිට ටැම්පිට විහාරය සහ මැණික්හින්න විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය ප්‍රමුඛස්ථානයක් ගනී.
ව්‍යාපෘතියේ පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම, කාර්යාල ගොඩනැගිල්ල උද්‍යානය හා ඒ අවට නඩත්තු කර දරශනීයව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.
මීට අමතරව ලෝක උරුම ඒකකයේ කාර්යයන් ද අඛණ්ඩව සිදු විය.

### සංරක්ෂණ අංශයෙන් සිදුවූ කාර්යයන් කිහිපයක්



(මැණික්හින්න රජමහා විහාරය සංරක්ෂණයට පසු)




(මල්වතු විහාර සංකීර්ණයේ වහලය සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයට පසු)




(කන්දපිට ටැම්පිට විහාරය සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයට පසු)



(කන්දපිට ටැම්පිට විහාරය බිතුසිතුවම් සංරක්ෂණය)



(බඹරගල විහාරය සංරක්ෂණය කළ බිතුසිතුවමක්)

# රම්බා විහාර ව්‍යාපෘතිය

## කැණීම් අංශය

මේ යටතේ ආරම්භ කළ කැණීම් අතර බිම් සැලැස්මේ භූමි අංක 21 ආරාම සංකීර්ණයේ භූ දර්ශනය පාදා ගැනීම හා එම ආරාම සංකීර්ණයේ දොරටුව කැණීම, 10/1 ආරාම කැණීම, 17/1 ආරාම කැණීම ආදී කාර්යයන් සිදු විය.

21 ආරාම සංකීර්ණයේ භූමි දර්ශනය නිරවුල් කර ගැනීමේ පරමාර්ථයෙන් සිදු කළ කැණීම මෙම වසරේ ජනවාරි මස සිට මැයි මස දක්වා ක්‍රියාත්මක වූ අතර එහි සියලු කාර්යයන් අවසන් කළ හැකි විය.

එසේම පසුගිය වසරේ සිදු කර තාවකාලිකව අත්හිටුවන ලද 10/1 ආරාම සංකීර්ණයේ කැණීම් ද මෙම වසර තුළ සිදු කර අවසන් කළ හැකි විය.

එසේම 21 ආරාම සංකීර්ණයේ ඇතුළත ප්‍රාකාරයේ දොරටුව සකස් කිරීම ද මෙම වසරේ සිදුවූ තවත් එක් සුවිශේෂී කාර්යයකි.

මීට අමතරව රුහුණු කවය යටතේ සිත්තම්ගල්ලෙන විහාරයේ ධර්මශාලාව අලුත්වැඩියා කිරීම, ගලගම ශෛලාරාමයේ විහාර මන්දිරය අලුත්වැඩියා කිරීම හා නයිගල රජමහා විහාරයේ වාහල්කඩ ඉදි කිරීම යන ව්‍යාපෘති වර්ෂය පුරා ක්‍රියාත්මක විය.

තව ද මැටි බඳුන් හා විශේෂිත පුරාවස්තු විශ්ලේෂණ ආදී කාර්යය ද වසර පුරා සිදු කරන ලදී.

## සංරක්ෂණ අංශය

මේ යටතේ කැණීම් මගින් මතු කර ගත් 21 ආරාම සංකීර්ණයේ ඇතුළත දොරටුව සංරක්ෂණය කරන ලදී.

එසේම පසුගිය වසර තුළ සිදු කළ සංරක්ෂණ කාර්යයන් තුළින් 17/1 ගොඩනැගිල්ලෙහි ඉතිරි වූ වැඩ කොටස මෙම වසර තුළ සිදු කර අවසන් කළ හැකි විය.

විද්‍යාත්මක නඩත්තු යටතේ සංරක්ෂිත ස්මාරක වල අත්‍යවශ්‍ය නඩත්තු කාර්යයන් කිහිපයක් මෙම වසරේ ද සිදු කළ අතර, අපේක්ෂිත කාර්යයන් වසර තුළ අවසන් කළ හැකි විය.

ස්මාරක හා ව්‍යාපෘති භූමියේ දෛනික නඩත්තුව, රසායනාගාරය හා පැරණි බදාම සංරක්ෂණය හා නියාමනය යන කාර්යයන් ද අඛණ්ඩව සිදු කෙරිණි.

# තිස්සමහාරාම ව්‍යාපෘතිය

## කැණීම් අංශය

අකුරුගොඩ පුරාවිද්‍යා පර්යේෂණ කැණීමට අදාළ කටයුතු මෙම වර්ෂය පුරාම ක්‍රියාත්මක විය. ප්‍රදේශයේ ඇති වර්තමාන මිනිස් ක්‍රියාකාරකම් අවම ලෙස සිදු වූ ස්ථානයක් ලෙස මෙම කැණීම් ප්‍රදේශය හඳුනාගෙන ඇති අතර, සියවස් ගණනාවක සිට මානව ජනාවාස තිබූ බවට සාධක බොහෝමයක් මේ මගින් අනාවරණය කර ගැනීමට හැකිවී ඇත.

මෙම කැණීමෙන් කාසි, කළු රතු මැටි බඳුන් කැබලි, පබළු, අස්ථි හා ආභරණ කොටස්, වීදුරු කොටස් හා පාෂාණ නිර්මාණ කිහිපයක් හමුවී ඇත.

මීට අමතරව විශේෂ පුරාවස්තු ඒකකය, රසායනාගාර (කතරගම කෞතුකාගාර හා ව්‍යාපෘති), කෞතුකාගාර නඩත්තු හා ප්‍රචාරක කටයුතු ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. ප්‍රචාරක අංශය යටතේ වර්ෂය පුරාවටම මසකට එකක් බැගින් ප්‍රාදේශීය පාසල්වල දේශන සංවිධානය කිරීම සහ නව වසර වෙනුවෙන් ප්‍රසංගයක් පැවැත්වීම යන කාර්යයන් සිදු කරන ලදී. මේ හැරුණුවිට කැණීම් භූමිය ආශ්‍රිත ව පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් ද මෙම වසරේ දී ක්‍රියාත්මක විය.

**කැණීම් අංශයට අදාළ කාර්යයන් කිහිපයක් පහත ඡායාරූප මගින් දැක්වේ.**



අකුරුගොඩ කැණීමෙහි වර්ෂ අවසානයේ කැණීම් ප්‍රගතිය දැක්වෙන ඡායාරූපයක්



සඳගිරි ස්තූපය පාදම කැණීම් අතරතුර



සඳගිරි ස්තූපය පාදම කැණීම් අතරතුර



සඳගිරි ස්තූපය පාදම කැණීම් අතරතුර

## සංරක්ෂණ අංශය

මෙම වර්ෂය පුරාවටම තිස්සමහාරාම ව්‍යාපෘතිය යටතේ සංරක්ෂණ කටයුතු රාශියක් සිදු විය. ඒ සියලු කටයුතු පහත සඳහන් පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

1. පොහොයගෙය සංරක්ෂණය
2. තිස්සමහාරාම චෛත්‍යයේ කොත සංරක්ෂණය
3. ස්තූප උතුරු හා දකුණු සීමාබැම් සංරක්ෂණය කිරීම
4. මහාවිහාරයේ වත මණ්ඩපය ඉදි කිරීම
5. සඳගිරි ස්තූප රථගාල ඉදි කිරීම
6. ස්තූප මලුවේ ගඩොල් ඇතිරීම
7. පුරාවස්තු පීඨිකා ඉදි කිරීම
8. බෝධි ප්‍රාකාරය ඉදි කිරීම
9. මෙහෙණි ආරාමයේ මුළුතැන්ගෙය ඉදි කිරීම
10. නඩත්තු කටයුතු

මේ අනුව සඳගිරි ස්තූපය අවට භූ දර්ශනය සැකසීමේ කාර්යයෙන් 90% ක ප්‍රමාණයක් මෙම වසරේ දී අවසන් කිරීමට හැකි වී ඇත. ඒ අනුව සඳගිරි ස්තූපයේ ඉහළ මළුවෙහි ගඩොල් ඇතිරීම ද විධිමත් ආකාරයෙන් පුරාවස්තු ස්ථාපිත කිරීමට අවශ්‍ය පීඨිකා සකස් කිරීම ද ඉපැරණි ස්තූපයක නිර්මාණ ලක්ෂණ පිළිබිඹු කෙරෙන අයුරින් ස්තූප අනුරුවක් ඉදි කිරීම ද සිදු විය.
ස්තූපයට වයඹ දිගින් ආසන්නයෙන් ම පිහිටි බෝධිඝරය සහිත කොටසෙහි බිම් මට්ටම සකස් කිරීම සහ කෙටි තාප්පයක් යෙදීම ද සිදු කරන ලදී. එසේම සඳගිරි ස්තූපයට බටහිර දෙසින් පිහිටි විශාල බෝධි වෘක්ෂය වටා ප්‍රාකාරයක් ඉදි කිරීම හා බුද්ධ ප්‍රතිමා තැන්පත් කිරීම ද සිදු විය.
ස්තූපයට ගිණිකොණ දිගින් පිහිටි පැරණි මෙහෙණි ආරාමයේ මුළුතැන්ගෙය වෙනුවට නව මුළුතැන්ගෙයක් ඉදි කිරීම ද සිදු විය.

මෙම විහාර භූමිය වෙත පැමිණෙන සංචාරක රථ නැවැත්වීම සඳහා රථගාල ඉදි කිරීමේ කටයුතු අවසන් කරන ලද නමුදු එහි භූමි අලංකරණ කටයුතු ඉදිරි වර්ෂය සඳහා කල් දමන ලදී. එසේම සඳගිරි ස්තූපයට පිවිසීමට සහ තදාශ්‍රිත ස්මාරකයන්ට ළඟා වීමට හැකි වන අයුරින් ඉදි කිරීමට යෝජිත වූ මාර්ග සැලැස්ම ද ඉදිරි වර්ෂය සඳහා ඉතිරි විය.

මෙම වර්ෂයේ දී සිදුවූ සුවිශේෂී සංරක්ෂණ කාර්යයක් ලෙස තිස්ස ස්තූපයේ පුපුරා ගිය කොත ආශ්‍රිත ප්‍රදේශය සංරක්ෂණය කරන ලදී. මෙහිදී කොත් කැරැල්ලේ ද දේවතා කොටුව හා හතරැස් කොටුවේ ද පිපිරුම් බන්ධනය වීම සඳහා බන්ධන මාධ්‍යයක් යෙදීම, ගැලවී තිබූ බදාම ස්තර කොටස් ඇලවීම හා කොතෙහි පිපිරුම් පාස්සා තීන්ත ආලේප කිරීම යන කාර්යයන් ද සිදු කරන

ලදී. එසේම මෙහිදී දුර්වල වී පැවති අකුණු සන්නායකය ඉවත් කර නව අකුණු සන්නායකයක් ද යොදන ලදී.

මීට අමතරව පොහොයගෙය සංරක්ෂණ කාර්යය ආරම්භ කිරීම ද මෙම වර්ෂය තුළ දී සිදු කරන ලද වැදගත් කාර්යයකි.

ව්‍යාපෘති පරිශ්‍රයේ නඩත්තු කටයුතු හා සංරක්ෂණ වාර්තා සකස් කිරීම ද වර්ෂය පුරාවට ම ක්‍රියාත්මක විය.

**සංරක්ෂණ අංශයට අදාළ කාර්යයන් කිහිපයක් පහත ඡායාරූප මගින් දැක්වේ.**




(සඳගිරි ස්තූපයේ මළුව සංරක්ෂණය කිරීමට පෙර සහ සංරක්ෂණය කිරීමෙන් අනතුරුව)



(ස්තූපය සංරක්ෂණය කෙරෙන අතරතුර)

## ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා ව්‍යාපෘතිය
## කැණීම් සහ ගවේශන අංශය

මුහුදු පුරාවිද්‍යා ඒකකය වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක වූ අතර, මේ මගින් ලංකාවේ නැගෙනහිර, උතුර හා වයඹ වෙරළ ආශ්‍රිතව ගිලී ඇති නෞකා පිළිබඳ ගවේෂණ තවදුරටත් ඉදිරියට කරගෙන යන ලදී. ඒ අතරම දැනට ගවේෂණය කර වාර්තාගත කර ඇති ගාලු වරාය ආශ්‍රිත මුහුදු පුරාවිද්‍යා වැඩබිම් වල ස්ථානීය සංරක්ෂණ කටයුතු හා නියාමනය ද වර්ෂය පුරාවටම සිදු කෙරිණි.

මීට අමතරව සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය මගින් නරඹන්නන් සඳහා දේශන, වැඩමුළු, ප්‍රදර්ශන හා දැනුවත් කිරීම් ද වර්ෂය පුරා සිදු කරන ලදී. විශේෂයෙන්ම ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා ඒකකයේ තුන්වන සංවත්සරය නිමිත්තෙන් 'සාම්ප්‍රදායික කරදිය ධීවර කර්මාන්තය' යන තේමාව යටතේ 'සමුද්‍රිකා' නමින් විශේෂ ප්‍රදර්ශනයක් සහ සමුළුවක් ද පැවැත්විණි.

එසේම ප්‍රචාරක අංශය මගින් දෙස් විදෙස් සංචාරකයින්ගේ දැනුවත්භාවය ඇති කිරීම සඳහා කෞතුකාගාරය පිළිබඳ විස්තර ඇතුළත් අත් පත්‍රිකාවක් නිර්මාණය කිරීම සහ සංචාරක මාර්ගෝපදේශන ග්‍රන්ථයෙහි (Travallanka) කෞතුකාගාරය පිළිබඳ විස්තර අතුළත් ප්‍රචාරක දැන්වීමක් පල කිරීම ද සිදු විය. මීට අමතරව පහත සඳහන් කාර්යයන් ද මෙම වසරේ දී ක්‍රියාත්මක කරන ලදී.

- කෞතුකාගාර කාර්යය මණ්ඩලයට නිල ඇඳුම් ලබා දීම
- තොරතුරු මධ්‍යස්ථානයට සහ ඇවොන්ස්ටර් මැදිරියට රූපවාහිනී යන්ත්‍ර සවි කිරීම
- ප්‍රවේශපත්‍ර අළෙවි කවුළුව නවීකරණය කිරීම
- කෞතුකාගාරයේ පිටවීමේ දොරටුව අසළ ආපන ශාලාව සහ සංචාරක වවේකී ස්ථානය ස්ථාපිත කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම
- ප්‍රකාශන සහ අනුරූ මධ්‍යස්ථානය සකස් කිරීම

එසේම කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ තෘප්තිමත් භාවය සහ යටිතල පහසුකම් සම්බන්ධයෙන් ඔවුන් දරන ආකල්පයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ අරමුණින් සංචාරක සමීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම ද මෙම වසර තුළ සිදුවූ තවත් වැදගත් කාර්යයකි.

# කැණීම් අංශය මගින් සිදු කළ කාර්යයන් කිහිපයක්




කෞතුකාගාරය විසින් පිළියෙල කළ අත්පත්‍රිකාව



නව අනුරූ මධ්‍යස්ථානය



දේශන හා විශේෂ ප්‍රදර්ශන වැඩසටහන්

# මුහුදු පුරාවිද්‍යා රසායනාගාරයේ පුරාවස්තු සංරක්ෂණ කටයුතු

කෞතුකාගාරය ඉදිරිපිට ප්‍රදර්ශනය කෙරෙන යකඩ නැංගුරම්, ලංකාවේ අවසන් වරට භාවිත කර ඇති දැවමය ඔරුපාරු, මැටි සහ වීදුරු වලින් නිර්මාණය කර ඇති පුරාවස්තු හා කෞතුකාගාර ගොඩනැගිල්ලෙහි පැරණි කොටුදොර දෙපස ඉහළින් ඇති බ්‍රිතාන්‍ය සහ ඕලන්ද ලාංඡන යනාදියෙහි නඩත්තු සංරක්ෂණ කටයුතු, ඇතුළත ප්‍රදර්ශන භාණ්ඩවල නඩත්තු කටයුතු, වීදුරු පෙට්ටිවල හායන කාරක මර්දනය හා සමුද්‍ර පුරාවිද්‍යා ඒකකයෙහි ඉදිරිපස ඇති දොඹකරයෙහි සංරක්ෂණ කටයුතු ආදිය මෙම වසර තුළ සිදුකරන ලදී.

තවද ගාලු කොටුව තුළ ඕලන්ද ගබඩා ගොඩනැගිල්ල හා ඒ ආශ්‍රිත භූමි ප්‍රදේශයේ නඩත්තු කටයුතු ද නිතිපතා ක්‍රියාත්මක විය.

එසේම රුහුණ විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා විශේෂවේදී අවසන් වසර සිසුන් සහභාගී කරගනිමින් සංරක්ෂණය පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුවක් හා වෙනත් ප්‍රදර්ශන ආදී කාර්යයන් රැසක් සංවිධානය කිරීම ද වසර පුරාවට සිදු විය.

**සමුද්‍ර පුරාවිද්‍යා ඒකකයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**



ඇතුළත ප්‍රදර්ශනය වන පුරාවස්තු නඩත්තු කටයුතු



කෞතුකාගාරය ඉදිරිපිට ඇති නැංගුරමේ සංරක්ෂණ සිදු වන අතරතුර

# වයඹ සංස්කෘතික චතුරශ්‍රය

## යාපහුව වැඩබිම

### කැණීම් අංශය

යාපහුව ව්‍යාපෘතිය මගින් මෙම වර්ෂයට අදාළව පිට දිය අගල, ගුරුගොඩ මෙගලිතික සුසානය, නාගොල්ල පධානඝර සංකීර්ණය හා ගුරුගොඩ ස්තූපය යන පුරාවිද්‍යාත්මක ස්ථාන කැණීම් කරන ලදී.

එසේම යාපහුව පැරණි රාජධානි භූමි සංකීර්ණය වටා පිහිටි ගුහා කිහිපයක් ද මෙම වසර තුළ කැණීම් කළ හැකි විය.

D13 නමින් හැඳින්වෙන ගුහා අභ්‍යන්තරයෙහි නැගෙනහිර බැවුම් කොටසේ පිහිටි බැම් කිහිපයක් කැණීම් කළ අතර මෙම කැණීම් මගින් සීමා මාලක, සඳකඩ පහණ හා මුරගල් ඇතුළු විශේෂ පුරාවස්තු කිහිපයක් හඳුනාගත හැකි විය.

එසේම ප්‍රවර්ධන වැඩසටහන්, කැණීම් වාර්තා සකස් කිරීම සහ මැටි බඳුන් අධ්‍යයනය යන කාර්යයන් ද වසර පුරාවට ක්‍රියාත්මක කරන ලදී.

## සංරක්ෂණ අංශය

මෙම වර්ෂයට අදාළ ව සිදු කළ කාර්යයන් ලෙස, පඩිපෙළෙහි දෙවන අදියර හා අංක 01 ගුහා කැණීමෙන් හමුවූ ආධාරක බැම්ම, පිටදිය අගල යන ස්ථාන සංරක්ෂණය හා පොදු සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනයට අදාළ කටයුතු කිහිපයක් සිදු කරන ලදී.

2012 වර්ෂයේ ඇස්තමේන්තුගත කාර්යයකට අනුව යාපහුව රජමහා විහාරයේ ගණ්ඨාර කුළුණේ වහලය සංරක්ෂණය කිරීම මෙම වසරේ දී සිදු විය. මෙහි දී දිරා ගිය දැව කොටස් හා කැඩී ගිය උළු ආදිය ඉවත්කර ප්‍රතිසංස්කරණය කළ අතර ඝණ්ඨාර කුළුණෙහි තීන්ත ආලේප කිරීම ද සිදු විය.

2012 වර්ෂයේ වැඩ නිම කිරීමට නොහැකි වූ පඩිපෙල සංරක්ෂණයේ දෙවන අදියර මෙම වසරේ ද එලෙසම ක්‍රියාත්මක කරන ලදී. මේ අනුව දුෂ්කර ප්‍රදේශ හරහා අධාරක බැම්මක් බැඳ පස් පුරවා පෙත්මග සකස් කිරීම ද මෙහිදී සිදු විය. යෝජිත සංරක්ෂණ කටයුතු වලින් 80% ක පමණ ප්‍රමාණයක් මෙම වර්ෂයේ දී නිම කිරීමට හැකි විය.

එසේම අංක 01 ගුහා කැණීමෙන් හමුවූ විශාල ආධාරක බැම්ම තහවුරු කිරීම ත් එහිදී හමුවූ ස්වාභාවික විපත් වලට ගොදුරු වී ඇති බැමි කොටස් ගලවා ඉවත්කර නැවත සවි කිරීම ත් සිදුකරන ලදී. මෙම වසරේ අගෝස්තු මාසය වන විට අංක 01 ගුහාවේ ආධාරක බැම්මෙන් 95% පමණ කොටසක් සංරක්ෂණය කර අවසන් කිරීමට හැකි වූ අතර අංක 2 ගුහාවේ බැම්ම සංරක්ෂණය ද මේ හා සමගාමීව සිදු විය.

2013 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට පිටදිය අගල සංරක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. පිටදිය අගලේ උතුරු අන්තයේ ගල් ගුහාව අසළ සිට සංරක්ෂණ කටයුතු ආරම්භ කළ අතර අඩි 21 ක් පමණ පළල් වු කොටසක සංරක්ෂණ කටයුතු මුළුමනින්ම නිමකර පස් පුරවා පිඩලි ඇල්ලීම සිදු කරන ලදී.

එසේම මෙම වසරේ දී සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනයට අදාළ ඉදිකිරීම් ද සිදු කළ අතර නව කාර්යාල පහසුකම් ඇති කරවීම සඳහා කන්ටේනර් පෙට්ටියක් ස්ථානගත කිරීම ද සිදු කරන ලදී. ව්‍යාපෘති භූමියේ නඩත්තු කටයුතු ද වර්ෂය මුළුල්ලේ ම සිදු විය.

**සංරක්ෂණ කටයුතු වලට අදාළ ඡායාරූප කිහිපයක්.**



පඩිපෙළෙහි දෙවන අදියර සංරක්ෂණය



ආධාරක බැම්ම සංරක්ෂණය





යාපහුව විහාරයේ ඝණ්ඨාර කුළුණ සංරක්ෂණයට පෙර සහ පසු

# දඹදෙණිය

## කැණීම් අංශය

මෙම වසරේ දී සිදු කළ කැණීම් අතර රැක්මලේ ගිරිගුහාරාම පැරණි ගොඩැල්ල කැණීම, දඹදෙණිය ශ්‍රී විජයසුන්දරාරාම විහාර උපෝසථඝරය දකුණුපස ප්‍රාකාර බැම්ම කැණීම, මාළිගාගල කැණීම ආදී කාර්යයන් ක්‍රියාත්මක විය.

මෙහිදී රැක්මලේ ගිරිගුහාරාම විහාරස්ථානයේ ඇති 'පඬරැල් සොරොව්ව' නම් කුඩා වැව ආසන්නයේ පිහිටි ගොඩැල්ලක පර්යේෂණ කැණීමක් සිදු කරන ලදී. සැලකියයුතු ප්‍රමාණයකින් ස්මාරක හෝ පුරාවිද්‍යාත්මක සාධක හමු නොවූ බැවින් මෙම ස්ථානයේ කළ කැණීම පර්යේෂණ කැණීමකට පමණක් සීමා කරන ලදී.

එසේම දඹදෙණිය ශ්‍රී විජයසුන්දරාරාම විහාරස්ථානයේ උපෝසථඝරය දකුණුපස ගොඩැල්ල කැණීම ද 2013 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා සිදු කළ අතර පැරණි ප්‍රාකාර බැම්මක සාධක එයින් අනාවරණය කර ගැනීමට හැකිවිය.

දඹදෙණිය මාළිගාගල පර්වත මස්තකයේ පිහිටි රජ මාළිගයේ මුල් අදියර කැණීම් ද මෙම වසරේ දී ආරම්භ කරනු ලැබීය. එහි දී පැරණි මාළිගයේ ඉදිකිරීම් සාධක හමු වූ අතර එහි අඩිතාලම සම්බන්ධ බැම් කොටස් ද මතු කර ගැනීමට හැකි විය. මෙම කැණීමෙන් පැරණි උළු, යකඩ ඇණ හා මැටි බඳුන් කැබලි ඇතුළු පුරාවස්තු රැසක් අනාවරණය කර ගන්නා ලදී.

### කැණීම් අංශයෙහි ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්



රැක්මලේ ගිරිගුහාරාම පැරණි ගොඩැල්ල කැණීමට පෙර භූමිය සකස් කර ගැනීම



ශ්‍රී විජයසුන්දරාරාම විහාර උපෝසථඝරය කැණීමට පෙර අවස්ථාව

## සංරක්ෂණ අංශය

විජයසුන්දරාරාම රජමහා විහාරස්ථානයේ කැණීම් තුළින් මතු වූ හදුනා නොගත් ගොඩනැගිල්ල හා ප්‍රාකාර බැම්ම එහි ශේෂව තිබූ සාධක වලට අනුව සංරක්ෂණය කිරීම, ඇත් පවුර සංරක්ෂණය කිරීම, විහාරස්ථානයේ උතුරු ප්‍රවේශයේ ගල් පඩිපෙල නවීකරණය කිරීම හා ටැම්පිට විහාරය ප්‍රතිසංස්කරණ කිරීම යන කාර්යයන් මෙම වසරේ දී සංරක්ෂණ අංශයෙන් සිදු වූ කාර්යයන් ලෙස පෙන්වාදිය හැකි ය.

මේ අනුව විජේසුන්දරාරාම රජමහා විහාරයේ කැණීම් තුළින් මතු වූ හදුනා නොගත් ගොඩනැගිල්ල එහි අවශේෂ වලට අනුකූලව සංරක්ෂණය කරන ලදී.

එසේම මෙහි පෞරාණික වටිනාකමට හානි වන පරිදි ඉදිකර තිබූ නව ඇත් පවුර ඉවත් කර පැරණි ගල් උපයෝගී කර ගනිමින් එය නැවත සංරක්ෂණය කිරීම ද සිදු විය.

විජයසුන්දරාරාම රජමහා විහාරස්ථානයේ උතුරු ප්‍රවේශයේ ගල් පඩිපෙල වෙනුවට පැරණි ගල් මෙන්ම ආදේශක ලෙස සකස් කරන ලද නව ගල් කුට්ටි උපයෝගී කරගෙන ප්‍රවේශය නැවත සකස් කරන ලදී.

එසේම බෝධීන් වහන්සේගේ ශාඛාවක් කඩා වැටීමෙන් විනාශයට පත් වූ ටැම්පිට විහාරස්ථානය ද ප්‍රතිසංස්කරණය කරන ලදී.

මෙහි පැරණි විහාර ගෘහයට ප්‍රවේශවන ගල් පඩිපෙළ නැවත සංරක්ෂණය කිරීම කළ අතර කාර්යාල පහසුකම් වැඩි දියුණු කර ගැනීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම ද මෙම වසරේ දී සිදු විය.

බිතුසිතුවම් සංරක්ෂණ අංශය යටතේ නක්කාවත්ත ටැම්පිට විහාරයේ සිතුවම් සංරක්ෂණය, කෝඳුරුවාපොළ ටැම්පිට විහාරය හා මැටියගනේ රජමහා විහාරය යන විහාරස්ථාන වල බිතුසිතුවම් සංරක්ෂණය කිරීම ද මෙම වර්ෂයේ දී සිදු විය.

මෙහිදී නක්කාවත්ත ටැම්පිට විහාරයේ දැවමය කොටස් සහ බදාමය විනාශවීමට හේතුවූ වේයන් හා කුඹල් සතුන් මර්දනය කිරීම, බිත්තිවල වරිච්චි සැකිල්ල සහ ආධාරක බදාම දිරාපත්වූ ස්ථාන සවිගැන්වීම, පෙති ගැලවෙමින් තිබූ වර්ණ ස්තරය නැවත සවි කිරීම, අක්‍රමවත් ලෙස පුරවා තිබූ බදාම ඉවත් කිරීමෙන් ඇතිවූ පළුදු ස්ථාන සහ බදාම කඩා වැටී තිබූ ස්ථාන ක්‍රමානුකූලව බදාම යොදා පිරවීම, වර්ණ ලබන ස්තරයේ පළුදු වූ තැන් නැවත පිරවීම, මැකීගිය බිතුසිතුවම් කොටස් නැවත මතුකර ගැනීම මෙන්ම මැකීගිය සිතුවම් කොටස් සහ පිළිම කොටස් ප්‍රතිනිර්මාණය කිරීම සිදු කළ අතර අර්ධයක් විනාශ වී තිබූ මකර තොරණ නැවත ගොඩනැගීම යන කාර්යයන් සිදු කරන ලදී.

එසේම කෝදුරුවාපොළ විහාරයේ සිතුවම් සහ පිළිම හානි වීම වැළැක්වීම සඳහා ඇතුළත දැල් මගින් ආවරණය කිරීම, නිධන් සොරුන් විසින් විනාශ කළ ප්‍රධාන බුදු පිළිමය සහ සෙසු පිළිම ප්‍රතිනිර්මාණය කිරීම, දිරාපත්වී ගරාවැටී තිබූ මකර තොරණ තහවුරු කර ගිලිහී ගිය කොටස් ප්‍රතිනිර්මාණය කිරීම යන කාර්යයන්ට අමතරව බිතුසිතුවම්හි වර්ණ ස්තරය තහවුරු කිරීම හා මැකී යමින් තිබූ සිතුවම් ප්‍රතිනිර්මාණය කිරීම යන කාර්යයන් සිදු කරන ලදී.

## සංරක්ෂණ අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප



විජේසුන්දරාරාම ටැම්පිට විහාරය සංරක්ෂණය අතරතුර





නක්කාවත්ත ටැම්පිට විහාරයේ සිතුවම් සහ මූර්ති සංරක්ෂණයට පෙර සහ පසු අවස්ථාව





නක්කාවත්ත ටැම්පිට විහාරයේ මකර තොරණ සංරක්ෂණයට පෙර සහ පසු අවස්ථාව





කෝඳුරුවාපොළ ටැම්පිට විහාරයේ පිළිම සංරක්ෂණයට පෙර සහ පසු

# පඬුවස්නුවර වැඩබිම

## කැණීම් අංශය

නිකසලා නුවර රජමහා විහාර භූමියේ ප්‍රාකාර බැම්ම පාදා ගැනීමේ දෙවන අදියරය සඳහා වූ කැණීම මෙම වසරේ දී ක්‍රියාත්මක විය. මෙහිදී ප්‍රාකාරය සම්පූර්ණයෙන්ම පාදා ගනු ලැබූ අතර, එමගින් උතුරු දිශානුගතව පිහිටා තිබූ ප්‍රවේශ දොරටුව ද හදුනා ගැනීමට හැකි විය. අවසන් අදියරය දක්වාම මෙම කැණීම ක්‍රියාත්මක විය.

එසේම ගොඩනැගිලි අංක 01 A කැණීම ද ක්‍රියාත්මක කරන ලදී. ශිලාමය පුවරු භාවිත කරමින් නිර්මාණය කර ඇති මෙම ආයත චතුරශ්‍රාකාර ගොඩනැගිල්ල වර්තමානයේ නිකසලානුවර ඉහළ විහාරයට ප්‍රවේශවන මාර්ගයට වම්පසින් පිහිටා ඇත.

ගොඩනැගිලි අංක 02 හි දෙවන අදියරයේ කැණීම ද මෙම වසරේ දී සිදු විය. දාන ශාලාවක් හා ජන්තාගරයක් සහිත මෙම ගොඩනැගිල්ල කැණීමෙන් විශාල වශයෙන් මැටි බඳුන් කොටස් හදුනා ගත හැකි විය.

පඬුවස්නුවර රජමහා විහාරයේ පොකුණ ඉදිරිපිට ඇති අවශේෂ ගොඩනැගිලි 01 හා 02 (PNB 01-02) හි කැණීම් කටයුතු සිදු කරන ලදී.

නිකසලානුවර පොකුණ කැණීම (NNPO) ද මෙම වසරේ සිදු කළ තවත් එක් කැණීම් ව්‍යාපෘතියකි.

එසේම නිධන් හොරුන්ගේ ග්‍රහණයට හසුව තිබූ ගොඩනැගිල්ලක් වන නාථගනේ ස්තූපය කැණීම ද මෙම වසරේ දී ආරම්භ කර අවසන් කළ ව්‍යාපෘති අතර වේ.

**මෙම කැණීම් අංශයෙහි ප්‍රගතිය දැක්වෙන අවස්ථා කිහිපයක් පහත දැක්වේ.**



නිකසලා නුවර ප්‍රාකාර බැම්ම කැණීමට පෙර හා කැණීමට පසු




නිකසලානුවර ගොඩනැගිලි අංක 01 A කැණීමට පෙර සහ පසු




නිකසලානුවර ගොඩනැගිලි අංක 02 කැණීම II වන අදියර ( NNB 2) කැණීමට පෙර සහ පසු




නිකසලානුවර පොකුණ ඉදිරිපිට ඇති අවශේෂ ගොඩනැගිලි 01 හා 02 කැණීමට පෙර සහ පසු

## සංරක්ෂණ අංශය

මේ යටතේ සංරක්ෂණ කාර්යයන් කිහිපයක් ක්‍රියාත්මක විය. ඒ අනුව,

1. පඬුවස්නුවර ආවාස ගෘහය සහ පිරිවෙන අතර පිහිටි නටබුන් ගොඩනැගිලි සංරක්ෂණය
2. ටැම්පිට විහාරය හා පිළිමගෙය සංරක්ෂණය
3. නිකසලානුවර පොකුණ සංරක්ෂණය
4. නිකසලානුවර ගොඩනැගිලි අංක 01 සංරක්ෂණය

ආවාස ගෘහය සහ පිරිවෙන අතර පිහිටි PNB 01 ගොඩනැගිල්ලෙහි සංරක්ෂණ කටයුතු විද්‍යානුකූලව සිදු කරන ලදී.

එසේම මෙම විහාර සංකීර්ණයෙහි විවෘත ආලින්දයෙහි වහලය හා ගෙබිම සංරක්‍ෂණ කටයුතු සිදු කෙරෙනු අතර ටැම්පිට විහාරයෙහි පහත ගෙබිම චිත්‍ර සහ මූර්ති සංරක්‍ෂණය ආදිය සිදු විය. ඉදිරිපස තොරණෙහි දිරාගිය කොටස්, වහලය සහ චිත්‍ර කොටස් ද සංරක්ෂණය කරන ලදී.

මෙම විහාරයේ නැගෙනහිර දිසාවට මුහුණ ලා ඇති පොකුණ කැණීම් කර සංරක්ෂණය කිරීම ද මෙම වසර තුළ සිදු කරන ලදී.

විහාරයේ දකුණු දෙසින් පිහිටි වාස්තු විද්‍යාත්මක ඉදිකිරීමක් වූ ගොඩනැගිලි අංක 01 සංරක්ෂණය කිරීම ද සිදු විය.

### සංරක්ෂණ අංශයට අදාළ කාර්යයන් හි ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්




පඬුවස්නුවර ආවාස ගෘහය සහ පිරිවෙන අතර පිහිටි නටඹුන් ගොඩනැගිලි සංරක්ෂණයට පෙර සහ පසු




ටැම්පිට විහාරය හා පිළිමගෙය සංරක්ෂණයට පෙර සහ පසු




පොකුණ සංරක්ෂණයට පෙර සහ පසු




නිකසලානුවර පොකුණ සංරක්ෂණයට පෙර සහ පසු

# කුරුණෑගල වැඩබිම

## කැණීම් අංශය

මේ යටතේ රිදී විහාරයේ සැරසුම්ගල පොකුණ කැණීම සිදු කළ අතර පැරණි බැම්මක සාධක මතු කර ගන්නා අරමුණින් සිදු කළ මෙම කැණීමෙහි සියලු කාර්යයන් මෙම වසරේ දී අවසාන කරන ලදී.

එසේම රිදී විහාරයේ ලෙන් කිහිපයක් කැණීම ද මෙම වසර තුළ සිදු වූ තවත් වැදගත් කාර්යයක් වේ.

## සංරක්ෂණ අංශය

සැරසුම්ගල පොකුණු බැම්ම සංරක්ෂණය සිදු කළ අතර මෙම වසර තුළදී අපේක්ෂිත කාර්යය අවසන් කළ හැකි විය.

එසේම සැරසුම්ගල පියගැටපෙළ දෙපස බැම්ම සංරක්ෂණය ද මේ යටතේ සිදුවූ තවත් වැදගත් සංරක්ෂණ කාර්යයකි.

රිදී විහාරයේ විහාරගෙයි බීරළුවැටෙහි පැරණි බීරළු ඉවත් කර ඊට ගැළපෙන අයුරින් ලාක්ෂා කර සකස් කරන ලද බීරළු යොදා සංරක්ෂණය කිරීම ද සිදු විය. එසේම විහාරගෙයි හේවිසි මණ්ඩපය, ආවාසගෙය අසළ කළුගල් බැම්ම, කුමාරබණ්ඩාර දේවාලයේ වහල, පත්තිනි දේවාලයේ වහල හා සොහොන් ගොඩනැගිල්ල යන ස්මාරක සංරක්ෂණය ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවූ තවත් වැදගත් සංරක්ෂණ වේ.

එසේම රිදී විහාරයේ දෛනික නඩත්තු කටයුතු හා පුරාවස්තු සංරක්ෂණ කටයුතු ආදිය වසර පුරාවටම සිදු කරන ලදී.

# බටලීය අනුරූ නිකේතනය

මෙම ව්‍යාපෘතිය අධ්‍යයන, නිෂ්පාදන හා අලෙවි යන අංශ තුනෙන් සමන්විත වන අතර 2013 වර්ෂය තුළ එකී අංශයන්හි ප්‍රගතිය පහත පරිදි පෙන්වා දිය හැකි වේ.

**01. අධ්‍යයන අංශය**

එක් එක් විෂානුබද්ධව පැවැත්වූ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් මෙම අංශය සඳහා නව සිසුන් බඳවා ගත් අතර එහි සංඛ්‍යාත්මක ප්‍රගතිය පහත පරිදි වේ.

| පාඨමාලාව | 2013 වර්ෂය සඳහා බඳවා ගත් සිසුන් ප්‍රමාණය |
|---|---|
| ගල් කැටයම් | 02 |
| පිත්තල වාත්තු සහ කැටයම් | 04 |
| ලී කැටයම් | 06 |
| සෙරමික් | 03 |

ඒ අනුව එක් එක් විෂයය නිර්දේශයන්ට අදාළව සිදු කරනු ලබන අධ්‍යයන කාර්යයන්, අධ්‍යයන චාරිකා හා මාසික වෘත්තීය පුහුණුව ලබා දීම ආදී කාර්යයන් වසර පුරාවට සිදු කරන ලදී.

**02. නිෂ්පාදන අංශය**

මෙම අංශය මගින් 2013 ජනවාරි සිට ඔක්තෝබර් මස දක්වා පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

i. කැලි ක්‍රමය යටතේ අනුරූ නිෂ්පාදන ඉලක්කයෙන් 40% නිම කිරීම.

ii. ලැබී ඇති බාහිර ඇණවුම් වලින් 70% ක් නිම කර භාර දීම.

iii. ආයතනයේ, ව්‍යාපෘතිවල හා අමාත්‍යාංශය මගින් ලැබුණු ඇණවුම් වලින් 80% ක් නිමකර භාර දීම.

මීට අමතරව පහත සඳහන් විශේෂ කාර්යයන් ද සිදු විය.

1. දැයට කිරුළ අමාත්‍යාංශ කුටි සැරසීම

2. අරන්තලාව වාහල්කඩ කැටයම් සවි කිරීම

3. බළල්ල ප්‍රාථමික විද්‍යාලයට එස්. මහින්ද හිමියන්ගේ පිළිරුවක් නිර්මාණය කිරීම

4. 2013 මැයි රථය සැරසීම

5. වෙසක් උත්සවය වෙනුවෙන් කොළඹ ඉසිපතන විද්‍යාලයේ ප්‍රදර්ශන කුටිය සැරසීම

6. වෙසක් උත්සවය වෙනුවෙන් බෞද්ධාලෝක මාවතේ වෙසක් රථ 04 ක් සැරසීම

7. මහර වෙසක් කලාපය

8. සඳහිරුසෑය නිධන් වස්තු සැකසීම

9. සියම් නිකායේ උපාලි හිමියන්ගේ පිළිරුව දැවයෙන් නිම කිරීම

**03. අලෙවි අංශය**

පුහුණු සිසුන් සහ ස්ථිර ශිල්පීන් විසින් දෛනික අලෙවිය සඳහා කැබලි ක්‍රමය යටතේ නිෂ්පාදන සිදු කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ. ඒ අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ එක් එක් ව්‍යාපෘති වල ක්‍රියාත්මක වන අනුරූ අලෙවිසැල් සඳහා නිෂ්පාදන බෙදා හැරීම වර්ෂය පුරාවටම සිදු කරන ලදී.

**අනුරූ නිකේතනයේ ප්‍රගතිය දැක්වෙන ඡයාරූප කිහිපයක්**



සිතුවම් පිටපත් කිරීමේ අංශය



ගල් කැටයම් අංශය



දැව කැටයම් අංශය

# මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රකාශන අංශය

ප්‍රකාශන අංශය යටතේ ප්‍රකාශන, මුද්‍රණ, ප්‍රචාරක, ඡායාරූප, ප්‍රලේඛන කටයුතු සිදු කෙරෙන අතර පුස්කොළ පොත් ගවේෂණය, සංරක්ෂණය, සුචිගත කිරීම හා පොත් අලෙවිය යන කාර්යයන් ද සිදු කරනු ලබේ. මීට අමතරව මෙම අංශය යටතේ පුස්තකාලයක් ද පවත්වාගෙන යනු ලැබේ.

ඒ අනුව මෙම වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සිදුවූ ප්‍රකාශන කටයුතු පහත පරිදි වේ.

1. අත්පිටපත් යතුරු ලියනය කරමින් පවතින ග්‍රන්ථ - 09
2. සංස්කරණය සහ සෝදුපත් බැලීම සිදු කරන ග්‍රන්ථ - 15
3. මුද්‍රණය සඳහා අවසාන පිටපත සකස් කර ඇති ග්‍රන්ථ - 15

මීට අමතරව පහත දැක්වෙන දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ද ප්‍රකාශන අංශය මගින් සිදු කළ තවත් වැදගත් කාර්යයන් කිහිපයකි.

- ඉසිපතන මිගදායේ වෙසක් කලාපය වෙනුවෙන් කරනු ලැබූ පොත් ප්‍රදර්ශනය සහ අලෙවිය
- කඩවත මහර වෙසක් කලාපයේ පුස්කොළ පොත් සංරක්ෂණය සහ අනුරූ ප්‍රදර්ශනය
- පූගොඩ ඕවිටිගම ප්‍රාථමික විද්‍යාලයේ සිසුන්ට විශේෂ දේශනයක් පැවැත්වීම
- ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දකුණු ආසියාතික උරුම සංගමය වෙනුවෙන් පැවැත්වූ පොත් ප්‍රදර්ශන සහ අලෙවිය
- බන්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ පොත් ප්‍රදර්ශනය සහ අලෙවිය

එසේම 2013 වර්ෂය තුළ ග්‍රන්ථ 09 ක් මුද්‍රණය කර අවසන් කළ අතර තවත් ග්‍රන්ථ 03 ක මුද්‍රණ කටයුතු සිදු වෙමින් පැවතුණි. මීට අමතරව දේශීය විදේශීය සංචාරක ප්‍රවේශපත්‍ර, අත්පත්‍රිකා, පෝස්ටර්, වවුචර් පත්‍ර සහ ආරාධනා පත්‍ර ඇතුළු සැලකියයුතු මුද්‍රණ කටයුතු සංඛ්‍යාවක් ද ප්‍රකාශන අංශය මගින් සිදු කරන ලදී.

මීට අමතරව ප්‍රචාරක අංශය මගින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.

- උත්තම ලංකා වැඩසටහන්
- කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනශ්‍රැති සහ සංස්කෘතික වටිනාකම් පිළිබඳව යෝජිත ප්‍රකාශනය සඳහා තොරතුරු රැස් කිරීම සහ ඡායාරූප 15 000 ක් එකතු කිරීම
- දක්ෂිණ මාධ්‍ය සංචාරයේ විද්‍යුත් සහ මුද්‍රිත ප්‍රචාරණ කටයුතු
- දකුණු ප්‍රදේශයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ස්ථාන ගවේෂණය හා ඡායාරූප ලබා ගැනීම

- 'ලස්සන හක්මන' පොසොන් කලාපයේ සහ සිත්තම්ගල්ලෙන විහාරයේ වාර්ෂික පෙරහැර මංගල්‍යයේ ප්‍රචාරක කටයුතු සිදු කිරීම

මීට අමතරව ඡායාරූප අංශය මගින් පුරාවිද්‍යාත්මක ස්ථානවල ඡායාරූප එකතුවක් සැකසීම සහ ඒවා ප්‍රලේඛනය කිරීම යන කාර්යයන් සිදු කරන ලදී.

එසේම පුස්තකාලය මගින් සියලුම ග්‍රන්ථ සුචිගත කිරීම, වර්ගීකරණය කිරීම සහ පුස්කොළ පොත් ගවේෂණ වාර්තා ලේඛනගත කිරීම යන කර්යයන් ද සිදු විය.

## මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2013 වර්ෂයට අදාළ වෙනත් ක්‍රියාකාරකම්

- ආගමික සිද්ධස්ථාන ඉදි කිරීම, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු

  රට පුරා විසිරී පවතින ආගමික සිද්ධස්ථාන වල නව ඉදිකිරීම්, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා 2013 වර්ෂය ඇතුළත රුපියල් 3, 630, 000. 00 ක් ප්‍රදාන වශයෙන් ලබා දෙන ලදී.

- ආගමික සිද්ධස්ථාන වල වාර්ෂික පෙරහැර මංගල්‍ය වෙනුවෙන් ආධාර ලබා දීම

  මේ යටතේ දිවයින පුරා පිහිටි ආගමික සිද්ධස්ථාන වල වාර්ෂිකව පවත්වනු ලබන පෙරහැර මංගල්‍ය සඳහා රුපියල් 1, 430, 000. 00 ක ආධාර වශයෙන් ලබා දී ඇත.

- වෙනත් සංස්කෘතික කටයුතු සඳහා ආධාර ලබා දීම

  නාට්‍ය සන්දර්ශන, පොහොය වැඩසටහන්, වෙනත් ආගමික උත්සව හා සංස්කෘතික සමුළු සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් මෙම වර්ෂයේ දී ආධාර වශයෙන් ලබා දී ඇති මුදල රුපියල් 16, 046, 000. 00 කි.

## මධ්‍යම සංස්කෘතික අරමුදල

## 2013 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා

## ආදායම් වියදම් ගිණුම

| | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| **ආදායම්** | | |
| ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම | 1,748,439,894 | 1,348,775,095 |
| අනුරූ අලෙවි ආදායම | (1,152,741) | (1,420,042) |
| ප්‍රකාශන අලෙවි ආදායම | 1,893,075 | 4,960,357 |
| මුද්‍රණාලයේ ආදායම | 1,245,586 | 462,561 |
| රජයේ අරමුදල් (භාණ්ඩාගාරයේ ආදායම) | - | 34,500,000 |
| ආයෝජන ආදායම | 53,063,839 | 33,883,468 |
| වෙනත් ආදායම් | 15,267,732 | 8,008,810 |
| | **1,818,757,387** | **1,429,170,249** |
| **වියදම්** | | |
| වැටුප් වේතන හා සේවක දීමනා | 919,234,392 | 759,032,384 |
| පාරිතෝෂිත | 66,949,750 | 31,636,288 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 42,359,757 | 26,165,069 |
| අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් | 17,162,616 | 10,215,791 |
| සැපයීම් හා පාරිභෝජන ද්‍රව්‍ය භාවිතය | 136,839,850 | 184,750,332 |
| දේපල, පිරියත හා උපකරණ අලුත්වැඩියාව | 37,778,087 | 37,576,846 |
| කොන්ත්‍රාත් සේවා | 40,732,730 | 32,531,571 |
| මූල්‍ය පිරිවැය | 135,429 | 112,345 |
| විගණක ගාස්තු | 250,000 | 200,000 |
| ප්‍රසාද දීමනා | 22,316,300 | - |
| වෙනත් වියදම් | 232,929,384 | 119,654,891 |
| | **1,516,688,295** | **1,201,875,516** |
| වර්ෂය සඳහා අතිරික්තය / ඌණතාවය | **302,069,092** | **227,294,733** |

## මධ්‍යම සංස්කෘතික අරමුදල

## 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය

| | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා බැංකු | 76,765,504 | 66,919,897 |
| ලැබිය යුතු | 70,489,618 | 31,725,169 |
| තොගය | 75,879,357 | 62,111,327 |
| ආයෝජන | 150,000,000 | |
| | **373,134,479** | **160,756,392** |
| **ජංගම නොවන වත්කම්** | | |
| ලැබිය යුතු | 194,307,192 | 149,067,966 |
| විශේෂ ආධාර ව්‍යාපෘති | | 626,471 |
| විදේශ ආධාර ව්‍යාපෘති | 676,432 | 676,432 |
| දේපල, යන්ත්‍ර හා උපකරණ | 962,176,003 | 899,791,139 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම | 398,461,894 | 316,689,060 |
| | **1,555,621,521** | **1,366,851,068** |
| **මුළු වත්කම්** | **1,928,756,000** | **1,527,607,460** |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත ගෙවීම් | 124,496,229 | 67,781,230 |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම | 425,353,599 | 367,413,407 |
| විශේෂ ආධාර ව්‍යාපෘති | 8,803,143 | 10,035,829 |
| විදේශ ආධාර ව්‍යාපෘති | 1,969,612 | 2,800,566 |
| මුළු වගකීම් | **560,622,582** | **448,031,032** |
| **ශුද්ධ වත්කම්** | **1,368,133,418** | **1,079,576,429** |
| **ප්‍රාග්ධන දායකත්වය** | | |
| සමුච්චිත අරමුදල | 19,944,705 | 19,944,705 |
| සංචිත | 16,064,386 | 16,064,386 |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | 447,395,000 | 451,428,000 |
| විදේශ ආධාර අරමුදල | 303,121,881 | 324,817,753 |
| සමුච්චිත අතිරික්ත / ඌනතා ගිණුම | 581,607,446 | 267,321,584 |
| | **1,368,133,418** | **1,079,576,429** |

## මධ්‍යම සංස්කෘතික අරමුදල
## 2013 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | |
|---|---|---|
| **මෙහෙයුම් අයිතම වලින් උත්පාදනය වූ මුදල් ප්‍රභවය** | | |
| වසරේ අතිරික්තය / ඌනතාවය | | 302,069,092 |
| **ගැලපීම් - මූල්‍ය නොවන අයිතම** | | |
| ක්ෂය වීම් | 42,359,757 | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 12,216,770 | |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම් ලාභය | 351,811 | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 66,949,750 | 121,878,087 |
| **කාරක ප්‍රාග්ධන අයිතම ගැලපීමට පෙර මෙහෙයුම් ප්‍රතිඵල** | | **423,947,179** |
| **කාරක ප්‍රාග්ධනය සඳහා වෙනස්වීම්** | | |
| ලැබිය යුතු | (45,239,226) | |
| තොගය | (13,768,030) | |
| උපචිත ගෙවීම් | 56,714,998 | (2,292,258) |
| **මෙහෙයුම්කටයුතු වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **421,654,921** |
| **ආයෝජන කටයුතු මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (135,260,732) | |
| ආයෝජන (වැඩිවීම/අඩුවීම) | (231,772,834) | |
| දිගුකාලීන ආයෝජන (වැඩිවීම/අඩුවීම) | (38,764,449) | |
| **ආයෝජන කටයුතු වලින් උත්පාදන වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(405,798,015)** |
| **මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | |
| විදේශ සම්පත් අරමුදල | 21,695,875 | |
| පාරිතෝෂික ගෙවීම | (27,100,958) | |
| විශේෂ ආධාර ව්‍යාපෘති | (606,215) | |
| විදේශ ආධාර ව්‍යාපෘති | (830,954) | |
| **මූල්‍ය අයිතමයන්ගේ භාවිතය** | | **(6,011,298)** |
| **ශුද්ධ මුදල් අඩුවීම- මුදල් හා මූල්‍ය සමාන අයිතම** | | **9,845,608** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන අයිතම | | 66,919,896 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතම** | | **76,765,504** |

# මධ්‍යම සංස්කෘතික අරමුදල 2013 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා

# ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | සමුච්චිත අරමුදල | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | විදේශීය සංචිතය | සමුච්චිත අතිරික්තය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2011.01.01 දිනට ශේෂය | 19,944,705 | 16,064,386 | | | 43,307,453 | 79,316,544 |
| එකතුකළා : | | | | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | 451,428,000 | | | 451,428,000 |
| විදේශ අරමුදල් | | | | 365,540,429 | | 365,540,429 |
| වසර සඳහා අතිරික්තය | | | | | 227,294,733 | 227,294,733 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | | | (3,280,602) | (3,280,602) |
| | 19,944,705 | 16,064,386 | 451,428,000 | 365,540,429 | 267,321,584 | 1,120,299,104 |
| අඩුකළා: | | | | | | |
| ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | | | | (40,722,676) | | (40,722,676) |
| 2012.12.31 දිනට ශේෂය | **19,944,705** | **16,064,386** | **451,428,000** | **324,817,753** | **267,321,584** | **1,079,576,428** |
| එකතුකළා : | | | | | | |
| විදේශ අරමුදල් | | | | (21,695,872) | | (21,695,872) |
| වසර සඳහා අතිරික්තය | | | | | 302,069,092 | 302,069,092 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | | | | |
| | 19,944,705 | 16,064,386 | 451,428,000 | 303,121,881 | 569,390,676 | 1,359,949,648 |
| අඩුකළා: | | | | | | |
| පෙර වසරේ ගැලපුම් | | | (4,033,000) | | 12,216,770 | 8,183,770 |
| 2013.12.31 දිනට ශේෂය | **19,944,705** | **16,064,386** | **447,395,000** | **303,121,881** | **581,607,446** | **1,368,133,418** |

(රහසිගතයි)　　　　　　　　　　　　**කෙටුම්පත**

ටීඑම්/ඒ/සීසීඑෆ්/1/13/24

අධ්‍යක්ෂ ජනරාල්,

මධ්‍යම සංස්කෘතික අරමුදල.

**මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2　**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යාන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

02. මූල්‍ය ප්‍රකාශන

2.1 විගණන මතය

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

(අ) සී.ස.සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගම සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති පුද්ගලික සමාගමක් වන අතර මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඇතැම් ඉදිකිරීම් හා සංරක්ෂණ කටයුතු මෙම සමාගම විසින් කොන්ත්‍රාත් පදනම මත ඉටුකරනු ලබයි. 2013 වර්ෂය තුල මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති වැඩබිම් වල කැණීම්/ සංරක්ෂණ සහායකයින් ලෙස කම්කරුවන් මෙම සමාගම මගින් සේවයේ යොදවා ඒ සඳහා රු. මිලියන 114.8 ක් සමාගමට ගෙවා තිබිණි.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තුල මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ තනතුරු දරන නිලධාරීන් දෙදෙනෙකුද, මධ්‍යම සංස්කෘතික අරමුදල කාර්ය මණ්ඩලයේ ගණකාධිකාරිවරයෙකු සමාගමේ ගණකාධිකාරී ලෙසද කටයුතු කරනු ලබයි. තවද සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ පෞද්ගලික ලේකම්වරයා එම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි. මධ්‍යම සංස්කෘතික අරමුදල හා සංස්කෘතික සංරක්ෂණ ඉදිකිරීම් පුද්ගලික සමාගම අතර පවත්නා මෙම සම්බන්ධතාවය හා ගනුදෙනු පිළිබඳ මූල්‍ය ප්‍රකාශ වලින් හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.)

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 106 ඡේදය අනුව වියදම් අයිතම ප්‍රමාණාත්මක වන විට ඒ පිළිබඳව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනම හෙළිදරව් කළයුතු වුවද පහත සඳහන් වියදම් අයිතම එසේ හෙළිදරව් කර නොතිබුණි.

| වියදම් විෂයය | වියදම<br>රු. |
|---|---|
| කොන්ත්‍රාත් පදනම මත කම්කරුවන් (Hire of Labour) | 126,248,717 |
| සංරක්ෂණ ද්‍රව්‍ය (Conservation Materials) | 82,815,009 |
| ඉන්ධන හා ලිහිසි තෙල් (Fuel & Lubricants) | 36,648,563 |
| අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් (Other Cultural Activities) | 62,345,256 |
| පුරාවිද්‍යා උරුමයන් සඳහා වැඩබිම් වෙනුවෙන් දායකත්වය (Contribution of Archeological Heritage sites ) | 170,000,000 |

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 7 අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනමටත් භාවිතා කරනු ලබන වත්කම් හා භාවිතයට නොගෙන අපහරනය සඳහා ඇති වත්කම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කළ යුතුය. එසේ වුවත්, 1982 සිට පැවත එන නමුත් මේ වනවිට ක්ෂය අවසන්ව ඇති රු. 106,469,071 ක් පිරිවැය වූ ලී බඩු හා සවිකිරීම් සහ උපකරණ මොනවාද යන්න හඳුනාගෙන නොතිබූ අතර භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමටත් වත්කම් වල සාධාරණ අගය නිශ්චය කර ගිණුම්ගත කිරීමටත් පියවර ගෙන නොතිබුණි. තවද ක්ෂය අවසන් කර ඇති වත්කම් ගිණුම් ප්‍රකාශ තුලින් හඳුනා ගැනීමට හැකියාවක් නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 7 අනුව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කරනවිට එක සමාන පන්තියේ ස්ථාවර වත්කම් සියල්ලම ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගත යුතුය. එසේ වුවත්, 2012 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්ව තිබුණු වාහන 98 කින් වාහන 34 ක් 2012 වර්ෂයේද වාහන 5 ක් 2013 වර්ෂයේද ප්‍රත්‍යාගණනය කර තිබූ අතර පිරිවැය රු. 14,252,724 වූ ඉතිරි වාහන 59 ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2013 දී ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 5 ක ප්‍රත්‍යාගණිත වටිනාකම වූ රු. 2,055,000 ක් ගිණුම්වලට ගෙන නොතිබූ හෙයින් මෝටර්රථ වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපනය නොවුනි.

(ඇ) දේපල, පිරියත හා උපකරණ වල අයිතිය සම්බන්ධයෙන් පවතින බාධාවන් හා සීමාවන් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කළ යුතුය. එසේ වුවත්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ වටිනාකම රු. 4,064,443 ක් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුලත් කර ගිණුම්ගත කර තිබුණද එම භූමියේ හිමිකම අරමුදල සතු නොවූ හෙයින් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය තිර නොතිබුණි.

### 2.2.3 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

අඩමාණ ණය වෙන්කිරීම් සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය කුමක්ද යන්න මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි. අඩමාණ ණය ලෙස සැලකිය යුතු ගිණුම් ශේෂ මොනවාද යන්න නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ අඩමාණ ණය ලෙස වෙන් කළ මුදල වූ රු.1,964,833 ක් සමාලෝචිත වර්ෂයේද අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණි.

### 2.2.4 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සුනාමි කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේදී රු.2,558,000 කට මිලදීගෙන තිබුණු ගාල්ල නුගගහවත්ත ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි. මෙම ඉඩම සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත පැවරීමට නියමිත බව විගණනය වෙත දක්වා තිබුණද ඒ සඳහා මෙතෙක් පියවර ගෙන නොතිබුණි.

(ආ) විදේශ ආධාර ප්‍රදානයන් ලෙස 1984 සිට 2004 දක්වා කාලය තුල ලැබී තිබුණු වාහන 21 කින් රක්ෂණය කරන ලද වටිනාකම රු.4,223,900 ක්වූ වාහන 11 ක සාධාරණ වටිනාකම ගණනය කර ප්‍රාග්ධනිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) ක්ෂය අවසන්ව ඇති, රු.3,509,828 ක් පිරිවැය වූ ගොඩනැගිලි මොනවාද යන්න හඳුනාගත හැකි ආකාරයට ගිණුම් පිළියෙල කර නොතිබුණි. එම නිසා එම වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට නොහැකිවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) පසුගිය වසරේ ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලි වලට අදාල ක්ෂය රු.1,050,000 ක් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට හර නොකර විදේශ සම්පත් අරමුදලට හර කර තිබීම හේතුවෙන් විදේශ සම්පත් අරමුදලේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය එම වටිනාකමින් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) 2012 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද වාහනයක පිරිවැය රු.1,100,000 ක් වුවද එය රු.2,200,000 ක් ලෙස ගිණුම්වලට ගැලපීම සම්බන්ධයෙන් වූ වරද නිවැරදි කිරීමේදී මෝටර් රථ ගිණුම රු.2,200,000 කින් හර කර එම වටිනාකම වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට බැර කළයුතු වුවත් බැර කර තිබුණේ මෝටර් රථ සමුච්චිත ක්ෂය ගිණුමටය. මේ නිසා මෝටර් රථ සමුච්චිත ක්ෂය ගිණුමේ ශේෂය රු.2,200,000 කින් වැඩියෙන්ද වත්කම් ප්‍රත්‍යාගණන සංචිත ගිණුම එම වටිනාකමින් අඩුවෙන්ද පෙන්නුම් කරයි.

(ඊ) 2013 වර්ෂයට වෙන්කරන ලද විගණන ගාස්තු රු.400,000 ක මුදල රු.250,000 දක්වා අඩු කිරීම සඳහා විගණන ගාස්තු ගිණුමට රු.150,000 ක් බැර කර සමුච්චිත අතිරික්ත ගිණුමට හර කර ඇත. මේ නිසා සමුච්චිත අතිරික්ත ගිණුමේ ශේෂය රු.150,000 ක් අඩුවෙන් පෙන්නුම් කලද ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුමෙන් එම වටිනාකම ඉවත් කර නොමැති නිසා එම ගිණුම රු.150,000 කින් වැඩියෙන් දැක්වේ.

(උ) 2013 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා වැයකර තිබූ රු.3,426,261 ක් දැයට කිරුළ වියදම් ගිණුමෙන් ප්‍රචාරණ වියදම (Advertising ) ගිණුමට මාරු කර ගිණුම්ගත කර තිබීම හේතුවෙන් දැයට කිරුළ සඳහා ගිය වියදම මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් වී නොතිබුණි. 2013 අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර ප්‍රතිපාදන සලසාගෙන නොතිබීම හේතුවෙන් දැයට කිරුළ වියදම මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඌ) සංචාරක ප්‍රවේශපත් මුද්‍රණය සඳහා සමාලෝචිත වර්ෂයේ වැයකර තිබූ රු.4,189,480 ක් මුද්‍රණ ද්‍රව්‍ය මිලදී ගැනීම් ගිණුමට ඇතුලත් කර සටහන් කර තිබීම හේතුවෙන් ප්‍රවේශපත් මුද්‍රණය සඳහා වැයවූ වියදම මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය වී නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුලදී වෙන්දේසි කර තිබූ හා ප්‍රයෝජනයට ගත නොහැකිව විනාශ කර තිබූ අබලි භාණ්ඩ වර්ග 758 කට අදාල තොග ලේඛනගත භාණ්ඩ ඒකක 6984 ක් හඳුනාගෙන ඒවායේ පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඛ) ගරුමුණි වලව්වේ හා ප්‍රධාන කාර්යාලයේ පැවති වෙන්දේසි කරන ලද හා විනාශ කරන ලද තොග ලේඛනගත අබලි භාණ්ඩ වල පිරිවැය රු.728,050 ක් ලෙස හඳුනාගෙන තිබුණද, එම පිරිවැය හා ඊට අදාල සමුච්චිත ක්ෂය ගිණුම් වලින් ඉවත් නොකර වෙන්දේසියෙන් ලැබී තිබූ රු.99,650 පමණක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ග) තිස්සමහාරාම ව්‍යාපෘතියේ 2013 වර්ෂයේ අබලි භාණ්ඩ වෙන්දේසියකදී ලැබී තිබූ රු.140,660 ක් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය හා අනිකුත් ආදායම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඝ) සමාලෝචිත වර්ෂය තුලදී පිරිවැය රු.4,280,060 ක්වූ අනුරූ නිෂ්පාදන හා නිෂ්පාදන ද්‍රව්‍යද, පිරිවැය රු.331,049 ක්වූ ප්‍රකාශන තොගද පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුණද ඒ සඳහා 2013 අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි. ඒ අනුව රු.4,280,060 ක්වූ පරිත්‍යාග වටිනාකමින් රු.1,226,680 ක් ප්‍රචාරණ වියදම් යටතේද, රු.3,053,380 ක් අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් යටතේද වියදමට ලියාහැර තිබූ හෙයින් පරිත්‍යාග සඳහා වැයවූ මුදල ගිණුම් වලින් අනාවරණය වී නොතිබුණි. තවද එම අනුරූ නිෂ්පාදන හා නිෂ්පාදන ද්‍රව්‍ය වල මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.6,930,892 ක් වුවද අනුරූ නිෂ්පාදන සඳහා වැයවූ අමුද්‍රව්‍ය, ශ්‍රමය හා පොදු කාර්යය වලින් 35 % ක් පමණක් පිරිවැය ලෙස සලකා සත්‍ය පිරිවැයට වඩා අඩුවෙන් පිරිවැය ගණනය කර ගිණුම්ගත කිරීමෙන් නිවැරදි වටිනාකම ගිණුම් වලින් නිරූපනය වී නොතිබුණි.

(ච) පරිත්‍යාග ලෙස ලබාදී තිබූ ඉහත සඳහන් අනුරූ නිෂ්පාදන හා ප්‍රකාශන තොගවල පිරිවැය එම වියදම් ගිණුම් වලට ගැලපීමෙන් තොරව නැවතත් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා මූල්‍ය ප්‍රකාශන වල ඊට අදාල මුළු වියදම රු.4,611,109 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඡ) පරිත්‍යාග ලෙස ලබාදී තිබූ අනුරූ නිෂ්පාදන හා ප්‍රකාශන තොගයන්හි පිරිවැය එකතුව රු.4,611,109 ක් අනුරූ විකුණුම් ගිණුමට හා ප්‍රකාශන විකුණුම් ගිණුමට බැරකර තිබීමෙන් සාවද්‍ය ලෙස අනුරූ විකුණුම් රු.4,280,060 කින් හා ප්‍රකාශන විකුණුම් රු.331.049 කින් මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා තිබුණි.

(ජ) කුවේට් එමීර් රාජ්‍යයේ 2013 අගෝස්තු 29 දින සිට සැප්තැම්බර් 02 දක්වා පැවැත්වූ වෙළඳ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීමට සහ තානාපතිවරු හා විශේෂිත පුද්ගලයන් වෙත පරිත්‍යාග කිරීමට රැගෙන ගිය විකුණුම් මිල පිළිවෙලින් රු.314,365 ක් හා රු.109,720 ක්වූ අනුරු නිෂ්පාදන සහ ප්‍රකාශන පිළිබඳව කිසිදු ගැලපීමක් මූල්‍ය ප්‍රකාශන වල සිදුකර නොතිබුණි.

(ඣ) 2013 වර්ෂයට අදාල පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කිරීමේදී, ඇතැම් සේවකයන්ගේ උපන් දිනය සේවයට බැඳුනු දිනය ලෙස සලකා ගණනය කර තිබීමෙන් වෙන්කර තිබූ පාරිතෝෂික මුදල ඉතා විශාල විය. සේවකයන් 17 දෙනෙකුගේ නියැදි පරීක්ෂාවේදී මෙසේ වැඩිපුර වෙන් කිරීම් කර ඇති පාරිතෝෂික වටිනාකම රු.5,680,221 ක් බව හෙළිදරව් විය. මේ අනුව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට හර කර තිබූ පාරිතෝෂික වටිනාකම සහ තත්ව ප්‍රකාශනය තුලින් වෙන් කර තිබූ ප්‍රමාණය නිවැරදි නොවන බව තහවුරු වූ අතර වර්ෂයේ වියදම් සහ වගකීම් සාවද්‍ය ලෙස එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඤ) ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම් උපලේඛනය අනුව, ස්ථාවර තැන්පතු 7 ක් 2013 වර්ෂය තුල කල් පිරීමේදී පොලී ලෙස ලැබී තිබූ ආදායම තුල ඇතුලත් 2013 වර්ෂයට අදාල රු.9,269,772 ක මුදලක්ද වර්ෂයේ ආයෝජන ආදායම ලෙස ගණනය කළයුතු වුවත් එසේ නොකිරීමෙන් වර්ෂයේ ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.5 <u>ලැබිය යුතු ගිණුම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථිර සේවකයින් 21 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 5 කට වඩා පැරණි රු.316,171 ක ආපදා ණය ශේෂ එකතුවක් හා ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොවූ කම්කරු සේවකයින් වෙත ලබාදී තිබූ වසර 6 කට වඩා පැරණි රු.366,721 ක ආපදා ණය ශේෂ එකතුවක් 2013 දෙසැම්බර් 31 ටත් හිඟහිටව පැවතුණි.

(ආ) ජංගම වත්කම් - ලැබිය යුතු ශේෂ ලෙස දක්වා ඇති වර්ෂ 5 කට වඩා පැරණි රු.1,290,000 ක්වූ උත්සව හා විශේෂ අත්තිකාරම් ශේෂ 2013 දෙසැම්බර් 31 දිනටත් හිඟහිටව පැවතුණි.

(ඇ) වර්ෂ 5 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු.420,817 ක්වූ ණයගැති ශේෂයක් හා අවු.05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු.493,968 ක ණයගැති ශේෂ 14 ක් අයකර ගැනීමේ පසු විපරම් තත්ත්වය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ඈ) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් අයවිය යුතු වර්ෂ 2 කට වඩා පැරණි රු.772,577 ක් හා වර්ෂ 5 කට වඩා පැරණි රු.20,598 ක් අයකර ගත නොහැකිව ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) 2008 වර්ෂයට අදාල රු.264,670 ක්වූ නොපියවූ අග්‍රිම ශේෂයක්ද, සීගිරිය ව්‍යාපෘති කාර්යාලය විසින් විවිධ ආයතන වෙත 1993 – 2000 කාලය තුලදී ලබාදී තිබූ අත්තිකාරම් රු.333,373 ක් හා වර්ෂ 7 කට වැඩි කාලයක සිට පවතින උසාවි තැන්පතු රු.44,534 ක්ද තවදුරටත් අය නොවී පැවතුණි.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට හෝ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ජංගම වත්කම් - විවිධ ණයගැතියෝ | 420,817 | වර්ෂ 5 කට වැඩි කාලයක සිට අයනොවී පවතින ණයගැතියන් පිළිබඳ විස්තරාත්මක උපලේඛන |
| (ආ) | හිඟ හිටි සේවක ණය | 1,290,020 | වර්ෂ 5 කට වඩා පැරණි උත්සව හා විශේෂ අත්තිකාරම් ශේෂ පිළිබඳ විස්තරාත්මක තොරතුරු |
| (ඇ) | පොළොන්නරුව පූජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට මාර්ගය කි.මී. 1 ක් සිමෙන්ති බ්ලොක් ගල් අතුරා සංවර්ධනය කිරීම - මාර්ග සංවර්ධන අධිකාරිය | 29,235,510 | විස්තරාත්මක ඇස්තමේන්තු, ප්‍රමාණ පත්‍රිකා (BOQ), මිනුම් වාර්තා, ගෙවීම් සහතික, විස්තරාත්මක ගෙවීම් බිල්පත් අතිරේක වැඩ ඉල්ලීම් නිර්දේශය හා අනුමැතිය පිළිබඳ විස්තර |
| (ඈ) | ගොඩනැගිලි හා මාර්ග යටිතල ව්‍යුහයන් | 540,536,673 | මෙම වත්කම් මොනවාද යන්න වෙන වෙනම හඳුනාගත හැකි පරිදි පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය |

| | | | |
|---|---|---|---|
| (ඊ) | හිඟ හිටි සේවක ණය | 366,721 | වර්ෂ 5 කට වඩා පැරණි ආපදා ණය ශේෂ පිළිබඳ තොරතුරු |
| (උ) | විශේෂ අරමුදල් ව්‍යාපෘති | 8,803,143 | විශේෂ අරමුදල් ශේෂ 10 කට අදාල වටිනාකමේ නිවැරදිතාවය තහවුරු කරගැනීමට හැකි ලිපිගොනු හා ලිඛිත සාක්ෂි |
| (ඊ) | විදේශ අරමුදල් ව්‍යාපෘති | 1,969,612 | විදේශ අරමුදල් 03 කට අදාල වටිනාකමේ නිවැරදිතාවය තහවුරු කරගැනීමට හැකි ලිපිගොනු හා ලිඛිත සාක්ෂි |

## 2.2.7 <u>නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම</u>

| | නීති රීති රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | විස්තරය |
|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික පනත | 1,952,529 | මෙම පනතේ විධිවිධාන වලට පටහැනිව සය මාසික ප්‍රායෝගික පුහුණුව සඳහා බඳවාගෙන සිටි පුහුණුවන්නන් 158 ක් වෙනුවෙන් පාරිතෝෂික වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,952,529 ක් වෙන් කිරීම කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය :<br>i) VII පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය | 2,332,515 | වැඩ බැලීමේ වැටුප් ගෙවීම සඳහා ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, අරමුදලේ තනතුරුවල වැඩ බැලීම/ රාජකාරී ඉටුකිරීම සඳහා එහි නිලධාරීන් යොදවා ලේකම්ගේ අනුමැතියකින් තොරව මාසික වැටුපෙන් 1/6 බැගින් වන පරිදි දීමනා ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | XXXIII පරිච්ඡේදයේ 5 සහ 6 වගන්ති | - | අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 1 වන වග උත්තරකරු සහ 2 වන හා 4 වන වග උත්තරකරුවන් පිළිවෙලින් එහි මුදල් අධ්‍යක්ෂ හා මධ්‍යම සංස්කෘතික අරමුදල ලෙස නම් කරමින් පවරා තිබූ නඩුවකදී නීතිපති විසින් වග උත්තරකීම භාරගෙන තිබියදී, ඉන් බැහැරව අරමුදල විසින් නීතිපති අනුමැතියකින් තොරව වෙනත් බාහිර පුද්ගලික නීතිඥවරුන් වෙත වග උත්තරකීම පවරා රු. 440,000 ක් ගෙවා තිබුණි. |
| (iii) | XI පරිච්ඡේදයේ 1.6 උපවගන්තිය | 440,000 | ඉහත නඩුව සඳහා දැරූ වියදම් ප්‍රතිපූර්ණය කිරීමේදී නඩුවෙහි විස්තර හා නිලධාරියාට ගිය වියදම් ඇතුලත් කර නීතිඥවරයා විසින් පිළියෙල කළ ප්‍රකාශයක්ද සමග අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව නීතිපති වෙත ඉදිරිපත් කර උපදෙස් ලබාගත යුතු වුවද, එසේ කිරීමෙන් බැහැරව 2 වන වග උත්තරකරු වන මුදල් අධ්‍යක්ෂ වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරියට ගෙවූ රු.190,000 ක් ඔහු විසින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. තවද 1 හා 4 වන වග උත්තරකරුවන්ගේ නීතිඥ සමාගමටද රු.250,000 ක් අරමුදලින් වියදම් දරා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2010 ඔක්තෝබර් 11 දිනැති අංක.මු.ක්‍ර.අ.01/2010/01 චක්‍රලේඛයේ 6.1 ඡේදය හා 9 (II) ඡේදය | - | විදේශ ගමන් වලදී සංයුක්ත දීමනා ගෙවිය යුතු වන්නේ පැය 24 පූර්ණ දිනයක් සඳහා වන දින ගණන අනුවය. නියමිත දින ගණන තහවුරු කර ගැනීම සඳහා අදාල ගුවන් ගමන් විස්තරය (ගුවන් ගමන් ප්‍රවේශපත්‍රයේ පිටපතක්) දීමනා ඉල්ලුම් වවුචර්පත් සමග ඉදිරිපත් කළයුතු නමුත් එසේ ඉදිරිපත් කර නොතිබූ හෙයින් 2013 විදේශ ගමන් සඳහා දීමනා ගෙවීමේදී දින ගණනේ නිවැරදිතාවය තහවුරු කර නොගෙන අරමුදල විසින් ගෙවීම් කර තිබුණි. |
| (ඇ) (i) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක.22/99 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 01 හා 02 ඡේද | 241,032<br>242,363 | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව වෙන් කළ වාහන හිමිකම නොමැති තනතුරු දරන නිලධාරීන් 3 දෙනෙකු වෙත අනුයුක්ත වාහන ලබාදී මසකට ඉන්ධන දීමනාව ලීටර් 120 බැගින් අනුමැතියකින් තොරව ලබාදී තිබුණි. තවද එම නිලධාරීන් දෙදෙනෙකු වෙත ගෙවන ඉන්ධන දීමනාවට අමතරව 2013 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.263,784 ක් හා රු.484,484 ක් වටිනා අමතර ඉන්ධන ලීටර් 2180 ක් හා 4004 ක් ලබාදී තිබුණි. |
| (ii) | 2008 ජුනි 26 දිනැති අංක. 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | 1,112,130 | අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල වාහනය සඳහා අනුමත ඉන්ධන ප්‍රමාණය මාසයකට ලීටර් 170 ක් වුවද එයට අමතරව ඇනවුම් වශයෙන් රු.1,112,130 ක් වටිනා ඉන්ධන ලීටර් 6,865 ක්ද අනුමැතියකින් තොරව 2013 වර්ෂය තුලදී ලබාගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තියට යොමුවූ ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 වගන්තිය | 720,000 | වෙළඳපල මිල සැදැහුම් ක්‍රමයෙන් භාණ්ඩ ප්‍රසම්පාදනයේදී ලංසුකරුවන් 5 කට නොඅඩු සංඛ්‍යාවකින් මිල ගණන් කැඳවිය යුතු වුවද අරමුදලේ සේවකයන් සඳහා ටීෂර්ට් 1200 ක් මිලදී ගැනීමේදී ආයතන 3 කින් පමණක් මිල කැඳවීම් කර තිබුණි. |
| (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය | 720,000 | වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය භාවිතා කරන්නේ නම් ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 7 ක් වුවද උක්ත මිලදී ගැනීමේදී පළමු දිනයේදීම මිල ගණන් ලබාගෙන තිබුණි. |

### 2.2.8 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය සාධන වාර්තා අනුව පුරාවිද්‍යා කැණීම් හා සංරක්ෂණ කටයුතු සඳහා සෘජු ද්‍රව්‍ය හා සෘජු ශ්‍රමය වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් රු.434,518,000 ක් වැයකර තිබුණද කැණීම් හා සංරක්ෂණ කටයුතු සඳහා මෙන්ම පුරාවස්තු ලඟ තබා ගැනීම සඳහා ද 1980 අංක 07 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත මගින් බලය පවරා නොතිබුණි. ඒ සඳහා බලය පැවරූ අධිකාරිය කුමක්ද යන්නට විගණනයේදී අනාවරණය නොවුණි.

(ආ) 1980 අංක 07 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 7 වන වගන්තිය අනුව සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වේ. මෙම තනතුර වෙනුවෙන් දීමනාවක් ගෙවීම සඳහා පනත මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණද අරමුදල විසින් ලේකම්වරයාගේ මාසික වැටුපෙන් 33 1/3 % ක් වන පරිදි මාසික දීමනාවක් ගෙවා තිබූ අතර 2013 වර්ෂයේදී ගෙවන ලද මුළු මුදල රු.241,356 ක් විය. මේ සඳහා ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 1.2 වගන්තිය හා 1999 මැයි 04 දිනැති අංක 374 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර ආයතන අධ්‍යක්ෂගේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොතිබුණි.

2012 විගණකාධිපති වාර්තාවේ 2.2.6 (අ ) ඡේදය මගින් ද මේ පිළිබඳව නිරීක්ෂණය කර ඇතත් අදාල අනුමැතිය ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

03. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් වලින් රු.302,069,092 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූප අතිරික්තය වූ රු.227,294,733 සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.74,774,350 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සංචාරක ප්‍රවේශපත් අලෙවි ආදායම රු.399,664,794 කින් වැඩිවීම හා සමානවම 2013 වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් වියදම් රු.314,812,779 කින් වැඩිවී තිබුණද ආදායම් වැඩිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි ප්‍රමාණාත්මක වැඩිවීමක් සිදුවී නොතිබුණි.

3.2 **විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) සංචාරක ප්‍රවේශපත් අලෙවිය හා සම්බන්ධ එම ප්‍රවේශපත් මුද්‍රණ වියදම 2012 වර්ෂයේදී රු.56,299,899 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.4,189,480 ක්වූ හෙයින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම සියයට 124 කින් අඩුවී තිබුණි. 2012 වර්ෂයේ එම වියදම ඊට පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 2291 කින් වැඩිවී තිබූ අතර සංචාරක ප්‍රවේශපත් මුද්‍රණ වියදම මෙසේ වාර්ෂිකව විශාල වශයෙන් උස් පහත් වීමට හේතුවී තිබුණේ ප්‍රවේශපත් මුද්‍රණය සඳහා විධිමත් හා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීමය.

(ආ) අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා වැයකර තිබූ මුදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව රු.62,345,256 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී එම වියදමෙහි වැඩිවීම රු.29,429,621 ක් හෙවත් සියයට 89 ක් විය. පන්සල් නවීකරණය කිරීම හා පෙරහැර සඳහා අනුග්‍රාහ ආධාර සැපයීම මේ යටතේ ප්‍රධාන වශයෙන් සිදුවී තිබූ අතර ඒ සඳහා සැලැස්මක් හෝ ඇස්තමේන්තුවක් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි. තවද ආධාර ලබාදීමේ නිර්ණායකයන් හෝ ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් නොකිරීම වැනි හේතු වියදම් වැඩිවීම කෙරෙහි බලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පාරිතෝෂික සඳහා වෙන් කිරීම වැඩිවීම රු.35,313,462 ක් හෙවත් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 112 කි. පාරිතෝෂික ගණනය කිරීමේ දෝෂ සහගත තත්ත්වයන් හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය සඳහා වූ එම වියදම ඉහළ ගොස් තිබුණි.

3.3 **ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි**

(අ) ඇණවුම් ප්‍රකාරව කාර්යය ඉටුකර දුන්නද තමන් වෙත අයවිය යුතු රු.379,137 ක් නොගෙවීම සම්බන්ධයෙන් එම මුදල් අයකර ගැනීමට බාහිර සමාගමක් විසින් අරමුදලට එරෙහිව 2010 වර්ෂයේදී නඩු පවරා තිබුණි.

(ආ) ඉජ ඇුෂ සංස්කෘතික අරමුදලට අයත් වාහනයක් මගින් සිදුවූ අනතුරක් නිසා වූ අලාභ වශයෙන් රු.500,000 ක් වන්දි ඉල්ලා බාහිර පාර්ශවයක් විසින් 2004 වර්ෂයේදී මධ්‍යම සංස්කෘතික අරමුදලට එරෙහිව නඩු පවරා තිබුණි.

(ඇ) සංචාරක ප්‍රවේශපත් මුද්‍රණය සඳහා ලංසු කැඳවා ලංසු ඇගැයීමේදී තමාට අසාධාරණයක් සිදුවූ බවත් එහෙයින් සාධාරණය ඉටුකර දෙන ලෙසත් පවසමින් ලංසු ඉදිරිපත් කරන ලද බාහිර සමාගමක් විසින් මධ්‍යම සංස්කෘතික අරමුදලට එරෙහිව 2012 වර්ෂයේදී නඩුවක් ගොනුකර තිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී වැඩ තහනම් කරන ලද අරමුදලේ සේවකයකු විසින් විනය පරීක්ෂණය අවසානයේ දුන් තීන්දුව පිළිනොගනිමින් තමන් අදාල චෝදනාවලට නිවැරදිකරු බවත් එහෙයින් විනය නියෝග අවලංගු කර හිඟ වැටුප් ද සහිතව යළි සේවයේ පිහිටුවන ලෙසත් ඉල්ලා මධ්‍යම සංස්කෘතික අරමුදලට එරෙහිව 2011 වර්ෂයේදී නඩු පවරා තිබුණි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර ඇස්තමේන්තු සකසා තිබුණද ක්‍රියාත්මක නොවූ කාර්යයන්**

(i) 2013 වර්ෂය තුලදී නිම කිරීමේ අපේක්ෂාවෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර ඇස්තමේන්තු සකසා තිබූ කැණීම් වැඩබිම් 11 ක ඇස්තමේන්තු පිරිවැය රු.6,973,555 ක්වූ වැඩ ඒකක 2305 ක්ද, සංරක්ෂණ වැඩබිම් 18 ක ඇස්තමේන්තු පිරිවැය රු.34,502,306 ක්වූ වැඩ ඒකක 6175 ක්ද වර්ෂය තුල ආරම්භ කර හෝ නොතිබුණි. ඉන් කීපයක් පහත දැක්වේ.

| ව්‍යාපෘතිය හා වැඩබිම | කැණීම් | | සංරක්ෂණ | |
|---|---|---|---|---|
| | ඒකක ගණන | ඇස්තමේන්තුගත පිරිවැය | ඒකක ගණන | ඇස්තමේන්තුගත පිරිවැය |
| | | රු. | | රු. |
| අභයගිරිය - | | | | |
| Repairs of Dormitory | - | - | 270.1 | 2,243,129 |

| | | | | |
|---|---|---|---|---|
| <u>පොළොන්නරුව -</u> wire Link fence around the Archaeological Reserve | - | - | 111.3 | 2,445,424 |
| <u>සීගිරිය -</u> Ancient wall at Southern end of the Summit | - | - | 1,119.6 | 4,396,535 |
| <u>පඬුවස්නුවර -</u> New Awasa for Panduwasnuwara Raja Maha Vihara | - | - | 1,673.7 | 11,058,718 |
| <u>කුරුණෑගල -</u> Moraluvava Vihara | - | - | 401.7 | 4,049,267 |
| <u>ගාල්ල -</u> Improvement to the Meritime Archaeology Building and Provision of divers facilities | 177.1 | 2,257,967 | - | - |

(ii) ඉහත කාර්යයන්ට අමතරව 2013 වර්ෂයේදී සැලසුම්ගත පහත සඳහන් කාර්යයන්ද නිම කිරීමට නොහැකිවී තිබුණි.

යාපහුව ව්‍යාපෘතිය - නාගොල්ල විහාරයේ ගොඩනැගිලි හා බිත්ති සංරක්ෂණය, ඇස්තමේන්තුගත මුදල රු.4,500,000

රුහුණු සංස්කෘතික කලාපය - ගරුමුණි වලව්ව සංරක්ෂණය ඇස්තමේන්තුගත මුදල රු.20,372,315

මහනුවර ව්‍යාපෘතිය - අස්ගිරිය පොතුහැර - මදුගල්ල විහාර සංරක්ෂණය ඇස්තමේන්තුගත මුදල රු.3,500,000

(ආ) **භෞතික හා මූල්‍ය කාර්ය සාධනය**

ව්‍යාපෘති 7 ක වැඩබිම් 32 ක් සඳහා වැඩ ඒකක 25,271 ක් 2013 වර්ෂය තුලදී නිම කිරීමට සැලසුම් කර රු.92,008,696 ක් ඇස්තමේන්තු කර තිබුණද 2013 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණේ වැඩ ඒකක 7,216 ක් පමණි. ඒ සඳහා තථ්‍ය වියදම රු.18,543,083 ක් හෙයින් භෞතික හා මූල්‍ය කාර්ය සාධනය සියයට 30 ට අඩු මට්ටමක පැවතුණි.

(ඇ) **2013 වැඩ සැලස්මට (ක්‍රියාකාරී සැලැස්ම) ඇතුලත් නොවූ නමුත් ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති**

(i) 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට (වැඩ සැලැස්ම) ඇතුලත් කර නොතිබූ කැණීම් හා සංරක්ෂණ වැඩබිම් 31 ක වැඩ ඒකක 15856 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.43,120,338 ක් ඇස්තමේන්තු කර එයින් වැඩ ඒකක 12886 ක් නිම කිරීම වෙනුවෙන් රු.30,253,179 ක් වැයකර තිබුණි.

(ii) ඉහත කාර්යයන්ට අමතරව 2012 වර්ෂයේ සිට ඉදිරියට එන පහත කාර්යයන් 2013 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණද ඒවා 2013 වැඩ සැලැස්මෙහි ඇතුලත් කර නොතිබීමට හේතුව පැහැදිලි නොවුණි.

- පොළොන්නරුව ගල් විහාරයේ පියස්ස ඉදිකිරීම - සංශෝධිත ඇස්තමේන්තුව රු.7,294,349 ක් මත 2013 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය සියයට 30 ක් පමණ වන අතර සහතික කළ වැඩ වෙනුවෙන් රු.2,427,644 ක් ගෙවා තිබුණි.

- පොළොන්නරුව පූජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට කි.මී.1 ක් සිමෙන්ති බ්ලොක් ගල් අතුරා වැඩිදියුණු කිරීම. සංශෝධිත ඇස්තමේන්තුව රු.48,575,893 කි. 2013 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය සියයට 90 ක් වන අතර ගෙවා තිබූ මුදල රු.29,235,510 ක් විය.

- නුවර ව්‍යාපෘතිය යටතේ මූලාදෑනි නවාතැන (Headman Lodge) සංරක්ෂණය වෙනුවෙන් වැඩ ඒකක 509 ක් සඳහා රු.2,456,491 ක් වැයකර තිබුණි.

) (i) 2013 වර්ෂය අවසාන වන විට කැණීම් වැඩබිම් 88 ක්ද සංරක්ෂණ වැඩබිම් 193 ක්ද වශයෙන් මුලු වැඩබිම් 281 ක් නිම කිරීමට සැලසුම් කර ඇස්තමේන්තු සකසා තිබුණද වැඩබිම් 27 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. වැඩබිම් 254 ක් නිමකර නොතිබුණද ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබූ වෙනත් වැඩ ඒකක ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා වියදම් දැරීම හේතුවෙන් නිමකළ වැඩ ඒකක ප්‍රගතිය සියයට 86 ක් වන අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 67 ක් බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය සංචාරක ප්‍රවේශපත් අලෙවිය වන අතර 2013 දී එම ආදායම රු.1,748,439,894 කි. එසේ වුවද මෙම ප්‍රවේශපත්‍ර මුද්‍රණයේදී පැහැදිලි පිරිවිතර, ප්‍රමාණවත් ආරක්ෂිත ක්‍රමවේදය, මුද්‍රණ කටයුතු හා තොරතුරු ලේඛනගත කිරීම සඳහා සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලය, තොග පාලනය, ප්‍රවේශපත් අලෙවිය හා ආදායම් ගණනය, ප්‍රවේශපත් අවලංගු කිරීම යන කරුණු වලට අදාල විධිමත් ක්‍රමවේදයක් මෙතෙක් හඳුන්වාදී නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රවේශපත් මුද්‍රණයේ අභ්‍යන්තර පාලන දුර්වලතා පැනනැගී තිබූ අතර විද්‍යුත් රේඛන (Bar Code System) වැනි නවීන තාක්ෂණ ක්‍රමවේදයක් යොදා ගනිමින් එය සංවර්ධනය කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයක සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ එහි වගකීම එහි ඉහල කළමනාකාරිත්වය වෙත පැවරෙන නමුත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2013 – 2016 කාලය සඳහා තුන් අවුරුදු සංයුක්ත සැලැස්ම සැකසීමේ කාර්යය රු.600,000 කට නිපුණතා සංවර්ධන අරමුදල වෙත පවරා තිබුණි.

(i) ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබී තිබුණේ එම මුදලට සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම යන දෙකම සැකසීමට වුවත් සංයුක්ත සැලැස්ම සැකසීම සඳහා පමණක් ගිවිසුමකට එළඹ තිබූ අතර 2012 ඔක්තෝබර් 10 දින එළඹි ගිවිසුමට අනුව එදින සිට සති 6 ක් ඇතුලත සංයුක්ත සැලැස්ම සකස් කර භාරදිය යුතු වුවද එය භාරදී තිබුණේ 2013 මැයි 13 දිනය. ප්‍රමාද ගාස්තු අඩුකර ගැනීම සඳහා ගිවිසුමෙහි කොන්දේසි ඇතුලත් කිරීමට අරමුදල පියවර ගෙන නොතිබුණි.

(ii) සංයුක්ත සැලැස්මට අනුගත වන පරිදි පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම එම සංයුක්ත සැලැස්මෙහි ඇතුලත් වියයුතු වුවද එසේ නොවූ අතර, 2013 වර්ෂය අදාල සමස්ත ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(iii) යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම පාලක මණ්ඩලය විසින් අනුමත කර එහි පිටපතක් වර්ෂය ආරම්භවීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2013 දෙසැම්බර් 31 වන විටත් එම සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී වැඩ තහනමට ලක්වූ නිලධාරියකු සම්බන්ධ විනය පරීක්ෂණය සිදු කිරීමේදී ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 22.1 උප වගන්තියට සංශෝධිත 2004 දෙසැම්බර් 15 දිනැති අංක.06/2004 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ II ඡේදය අනුව කටයුතු කර විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් නිමකර නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ඔහුගෙන් අයකරගත යුතුව පැවති දේපල ණය ශේෂය රු.407,719 ක්ද මෙතෙක් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

(ඈ) අරමුදලේ විධායක හා මාණ්ඩලික නිලධාරීන් බොහොමයක් සඳහා උසස්වීම් සහ වැටුප් වර්ධක ලබාදීම මෙන්ම සේවයේ ස්ථිර කිරීම වැනි අවස්ථාවලදී එම සංසිද්ධි හා සමගාමීව සලකා බැලිය යුතු වැදගත් ලිපිලේඛන ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු තුල අඩංගු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව වෛද්‍ය සහතික, වත්කම් බැරකම් ප්‍රකාශ, අධ්‍යාපන සහතික, සේවා සහතික හා සේවයේ ස්ථිර කිරීම් පිළිබඳ ලිපි ආදිය නොමැතිව උසස්වීම් හා වැටුප් වර්ධක ද ලබාදී තිබූ අතර දේපල ණය මෙන්ම මෝටර් රථ ණය ලබාදීමද සිදුකර තිබුණි.

4.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) <u>පුරාවිද්‍යා කැණීම් සඳහා අනුමැතිය</u>

(i) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතේ 06 සහ 07 වගන්ති අනුව පුරාවිද්‍යා කැණීම් වලදී කැණීම් සිදුකරනු ලබන භූමිය පිළිබඳ සියළු තොරතුරු ඉදිරිපත් කර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු වුවද, අරමුදල විසින් 2013 වර්ෂයේ කිරීමට අපේක්ෂිත කැණීම් ව්‍යාපෘති 10 ක් සඳහා වූ වැඩ සැලැස්ම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඊට එකඟතාවය ලබාදෙන ලෙස ඉල්ලීම් කර තිබුණේ 2013 ජුනි 30 දිනදීය.

(ii) උක්ත ආඥා පනතේ 10 වගන්තිය අනුව කැණීම් වලදී සොයාගනු ලැබූ සියළු පුරාවස්තු පිළිබඳ වාර්තා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් මෙතෙක් එසේ ඉදිරිපත් කර නොතිබුණි. තවද කැණීම් වලදී සොයාගනු ලබන විශේෂිත පුරාවස්තු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු වුවත් එවැනි භාරදීමක් සිදුකර නොතිබුණි.

(iv) අරමුදල මගින් සිදුකරනු ලබන කැණීම් සම්බන්ධ වාර්තා පිළියෙල කර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් මෙතෙක් එම වාර්තා යවා නොතිබුණි.

(ආ) බාහිර පාර්ශවයන්ට ලබාදුන් ද්‍රව්‍ය

අභයගිරිය හා ආලාහන ව්‍යාපෘති මගින් බාහිර පාර්ශවයන්ට ලබාදී තිබූ පහත සඳහන් ද්‍රව්‍ය ආපසු ලබා ගැනීමට 2014 ජූනි 31 තෙක් කටයුතු කර නොතිබුණි.

| ලබාදුන් ද්‍රව්‍ය | | ලබාදුන් ප්‍රමාණය | ලබාදුන් දිනය |
|---|---|---|---|
| අභයගිරිය - | GI බට | 2000 | 2013.07.24 |
| | කප්ලීන් | 3050 | 2013.09.25 |
| | GI බට | 789 | 2011.02.27 සිට 2013.03.15 දක්වා කාලය තුල අවස්ථා 10 කදී ලබාදී ඇත |
| | කප්ලීන් | 863 | |
| ආලාහන - | GI බට | 251 | 2013 වර්ෂය තුල සෞඛ්‍ය අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්ට හා තමන්කඩුව ප්‍රාදේශීය සභාවට ලබාදී ඇත |
| | කප්ලීන් | 580 | |

(ඇ) අපහරණය නොකළ වත්කම්

2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් අනාවරණය කරගෙන තිබූ පරිදි අරමුදල සතුව පවත්නා පහත සඳහන් අබලන් වාහන අනාරක්ෂිතව ගාල්කර ඇති බවත් ඒවා වෙන්දේසි කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට 2014 ජූලි 31 තෙක් කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

| පවත්නා ස්ථානය | වාහන වර්ගය හා සංඛ්‍යාව | පවතින කාලය |
|---|---|---|
| අභයගිරිය | ට්‍රැක්ටර් 2 | වසර 3 කට වැඩි |
| | ත්‍රීවීලර් 1 | - එම - |
| | ඩබල් කැබ් 1 | වර්ෂ 4 කට වැඩි |
| | යතුරු පැදි 2 | - එම - |

| | | |
|---|---|---|
| අනුරු පාසැල | කැබ් රථ 1 | වර්ෂ 1 ට වැඩි |
| ප්‍රධාන කාර්යාලය | මෝටර් කාර් 1 | - එම - |
| | කැබ් රථ 2 | - එම - |
| සීගිරිය ව්‍යාපෘතිය | ලොරි රථ 1 | වර්ෂ 3 ට වැඩි |

(ඈ) **ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබීම**

අරමුදල සතුව පවතින වාහන වල ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් මාස 6 කට වරක්වත් සුදුසුකම් ලත් ඉංජිනේරුවරයකු මගින් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වාහන වල ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂා කර ඒ අනුව දෛනික ධාවන සටහන් පත්වල ඉන්ධන ගැලපීම සිදුකිරීම තුලින් වාහන වල ඉන්ධන පරිභෝජනය පිළිබඳ නිවැරදි තහවුරුවක් ලබාගත හැකි වුවද එසේ කටයුතු කර නොතිබීමෙන් 2013 වර්ෂය සඳහා සමස්ථ ආයතනයේ ඉන්ධන පරිභෝජන වියදම සංශෝධිත අයවැය ඇස්තමේන්තුවද ඉක්මවා සියයට 22 කින් වැඩිවී තිබුණි.

(ඉ) **උපදේශකවරු බඳවා ගැනීම හා ඔවුන්ගේ සේවාව**

(i) අරමුදලේ ව්‍යාපෘති වල කටයුතු සඳහා උපදේශක අධ්‍යක්ෂවරු හා වාස්තු විද්‍යා උපදේශකවරු 14 දෙනෙකු 2013 වර්ෂය තුලදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණද ඔවුන්ගෙන් බලාපොරොත්තු වන සේවය හා ඉටු කළයුතු රාජකාරී මොනවාද යන්න පිළිබඳව මෙන්ම ඔවුන් විසින් සිය වාර්තා ඉදිරිපත් කළයුතු ආකාරය හා ඒවායේ ඇතුලත් වියයුතු කරුණු මොනවාද යන්න පිළිබඳ පැහැදිලි උපදෙස් ලබාදී නොතිබුණි. මෙ නිසා ඇතැම් උපදේශකවරු කිසිදු වාර්තාවක් ලබාදී නොතිබුණ අතර මාසිකව ස්ථාවර දීමනාවක්ද ඉන්ධන සඳහා දීමනාවක්ද ලබාගනිමින් ඔවුන් කළ සේවාව කුමක්ද යන්න විගණනයේදී තහවුරු නොවුණි.

(ii) අරමුදලේ අවශ්‍යතාවය අනුව පුරාවිද්‍යා දැනුම ඇති එම ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් උපදේශකවරු හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරු ලෙස බඳවා ගතයුතු බැවින් ව්‍යාපෘතිය, එහි කාර්ය භාරය, සුදුසුකම්, අවශ්‍ය පලපුරුද්ද, ගෙවන දීමනාව හා ඉටුකළ යුතු රාජකාරී ඇතුලත් මූලික ආකෘතියක් හෝ සැලැස්මක් ඒ සඳහා සකසා ගතයුතු අතර පාලක මණ්ඩල අනුමැතිය හා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 4.4 විවාදයට තුඩුදෙන ගනුදෙනු

### (අ) පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම

පොළොන්නරුව පූජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට මාර්ගය කි.මී. 01 ක් සිමෙන්ති බ්ලොක් ගල් අතුරා වැඩිදියුණු කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.27,500,000 කට 2012 මාර්තු 19 දින පවරා තිබුණි. 2013 දෙසැම්බර් 31 වන විට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබූ මුදල රු.29,235,510 ක් විය. පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) අරමුදල විසින් මූලික පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර පැහැදිලි පිරවිතරයන්ද ලබාදී නොතිබුණි. පැහැදිලි පිරිවිතරයන් ලබා දී නොතිබියදී අනුමැතියකින් තොරව පාරේ පළල මීටර් 4.5 සිට 6.2 දක්වා වැඩි කිරීම හා ප්‍රමිතයෙන් බැහැරව තාර ස්ථරයක් යොදා ඒ මත සිමෙන්ති බ්ලොක් ගල් ඇතිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත මුදල රු.48,575,893 ක් දක්වා ඉහල ගොස් තිබුණි. මෙසේ වැඩිවීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාගෙන නොතිබුණි.

(ii) සිමෙන්ති ගල්වල ප්‍රමිතිය 40 N/mm$^2$ ශක්තියෙන් වියයුතු වුවත්, මාර්ගයේ අතුරා තිබූ ගල් පිළිබඳ අරමුදල විසින් 2013 නොවැම්බර් 22 දින ලබාගෙන තිබූ තත්ව පරීක්ෂණ වාර්තාව අනුව පරීක්ෂා කළ ගල් 20 කින් ගල් 17 ක්ම නියමිත ප්‍රමිතියට වඩා ශක්තියෙන් අඩු ඒවා වුවත් එම ගල් සඳහා අරමුදල විසින් රු.16,992,545 ක්වූ සම්පූර්ණ මුදල ගෙවා තිබුණි. තවද කොන්ත්‍රාත්කරුගේ බිල්පත් සඳහා ගෙවීම් කිරීමට පෙර අරමුදල විසින් ඉදිකිරීම් වල තත්ව පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(v) පුරාවිද්‍යා ස්මාරක සහිත ප්‍රදේශ වල මාර්ග සංවර්ධනය කිරීමේදී තාර යෙදීම නිර්දේශ නොකරන නමුත් මෙම මාර්ගයට තාර යොදා තිබූ අතර එම වරද නිවැරදි කිරීම සඳහා තාර ස්ථරය මත නැවතත් ABC මිශ්‍රණය යොදා සිමෙන්ති ගල් අතුරා තිබුණි. එය සම්පූර්ණයෙන්ම ප්‍රමිතියෙන් බැහැර ඉදිකිරීමක් විය.

(iv) ගිවිසුම අනුව දින 90 කින් ඉදිකිරීම් නිම කළයුතු වුවද 2013 දෙසැම්බර් 31 වන විටත් එම කටයුතු සම්පූර්ණයෙන්ම නිමකර නොතිබුණි. කොන්ත්‍රාත් විචලනයන්, ඉදිකිරීම් ප්‍රමාදය සඳහා ප්‍රමාද ගාස්තු හා ප්‍රමිතියෙන් බැහැර ඉදිකිරීම් පිළිබඳ ප්‍රතිපාදනයන් ගිවිසුමේ ඇතුලත් කර නොතිබීම අරමුදලට අවාසිදායක වී තිබුණි.

4.4 මහජනයාට තුඩුදෙන ගනුදෙනු

(අ) පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම

පොළොන්නරුව පූජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට මාර්ගය කි.මී. 01 ක් සිමෙන්ති බ්ලොක් ගල් අතුරා වැඩිදියුණු කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.27,500,000 කට 2012 මාර්තු 19 දින පවරා තිබුණි. 2013 දෙසැම්බර් 31 වන විට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබූ මුදල රු.29,235,510 ක් විය. පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) අරමුදල විසින් මූලික පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර පැහැදිලි පිරවිතරයන්ද ලබාදී නොතිබුණි. පැහැදිලි පිරිවිතරයන් ලබා දී නොතිබියදී අනුමැතියකින් තොරව පාරේ පළල මීටර් 4.5 සිට 6.2 දක්වා වැඩි කිරීම හා ප්‍රමිතයෙන් බැහැරව තාර ස්ථරයක් යොදා ඒ මත සිමෙන්ති බ්ලොක් ගල් ඇතිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත මුදල රු.48,575,893 ක් දක්වා ඉහල ගොස් තිබුණි. මෙසේ වැඩිවීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාගෙන නොතිබුණි.

(ii) සිමෙන්ති ගල්වල ප්‍රමිතිය 40 N/mm$^2$ ශක්තියෙන් වියයුතු වුවත්, මාර්ගයේ අතුරා තිබූ ගල් පිළිබඳ අරමුදල විසින් 2013 නොවැම්බර් 22 දින ලබාගෙන තිබූ තත්ව පරීක්ෂණ වාර්තාව අනුව පරීක්ෂා කළ ගල් 20 කින් ගල් 17 ක්ම නියමිත ප්‍රමිතියට වඩා ශක්තියෙන් අඩු ඒවා වුවත් එම ගල් සඳහා අරමුදල විසින් රු.16,992,545 ක්වූ සම්පූර්ණ මුදල ගෙවා තිබුණි. තවද කොන්ත්‍රාත්කරුගේ බිල්පත් සඳහා ගෙවීම් කිරීමට පෙර අරමුදල විසින් ඉදිකිරීම් වල තත්ව පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(v) පුරාවිද්‍යා ස්මාරක සහිත ප්‍රදේශ වල මාර්ග සංවර්ධනය කිරීමේදී තාර යෙදීම නිර්දේශ නොකරන නමුත් මෙම මාර්ගයට තාර යොදා තිබූ අතර එම වරද නිවැරදි කිරීම සඳහා තාර ස්ථරය මත නැවතත් ABC මිශ්‍රණය යොදා සිමෙන්ති ගල් අතුරා තිබුණි. එය සම්පූර්ණයෙන්ම ප්‍රමිතියෙන් බැහැර ඉදිකිරීමක් විය.

(iv) ගිවිසුම අනුව දින 90 කින් ඉදිකිරීම් නිම කළයුතු වුවද 2013 දෙසැම්බර් 31 වන විටත් එම කටයුතු සම්පූර්ණයෙන්ම නිමකර නොතිබුණි. කොන්ත්‍රාත් විචලනයන්, ඉදිකිරීම් ප්‍රමාදය සඳහා ප්‍රමාද ගාස්තු හා ප්‍රමිතියෙන් බැහැර ඉදිකිරීම් පිළිබඳ ප්‍රතිපාදනයන් ගිවිසුමේ ඇතුලත් කර නොතිබීම අරමුදලට අවාසිදායක වී තිබුණි.

(ඇ) **අංක. PE – 0774 දරන වාහනයේ අලාභහානි**

අනතුරටපත් අංක. PE – 0774 දරන වාහනයේ අලාභහානි වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් 2013 දෙසැම්බර් මස ලැබී තිබුණු රු.5,139,050 ක්වූ චෙක්පත භාරනොගෙන 2014 මාර්තු 19 දින ආපසු යවා තිබූ අතර අදාල මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට චෙක්පත බැංකුගත නොකර ආයතනයේ රඳවාගෙන තිබූ අතර එය ණයගැතියන් යටතේ ගිණුම්ගත කිරීම මතභේදයට තුඩුදේ.

(ඈ) **සීගිරිය ව්‍යාපෘතියේ අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියාව සඳහා බොරළු මිලදී ගැනීම**

(i) 2013 වර්ෂය තුල රු.1,718,125 ක බොරළු මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩල අනුමැතියකින් තොරව මධ්‍යම සංස්කෘතික අරමුදලේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් වෙත මිල කැඳවීම් යවා තිබූ අතර එම සැපයුම්කරුවන් තෝරාගත් ආකාරය විනිවිදභාවයකින් තොරව සිදුවී තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 වගන්තියට පටහැනිව කටයුතු කරමින් මිල ගණන් විවෘත කරනු ලබන වේලාව ලෙස ටෙන්ඩර් දැන්වීමේ සඳහන් දිනයේ නොව ඊට දින 6 කට පසු, ලංසුකරුවන්ගේ සහභාගීත්වයෙන් තොරව මිල ගණන් විවෘත කර තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 වගන්තියේ උපදෙස් වලට පටහැනිව කටයුතු කරමින් ටෙන්ඩර් ලියවිලි ගාස්තු හා ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබූ සැපයුම්කරුවන්ගේ ලංසුද ඇගයීමට භාජනය කර තිබූ අතර රු.718,125 ක් වටිනාකමැති ටෙන්ඩරයක් ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබූ සැපයුම්කරුවකු වෙතද රු.500,000 ක ටෙන්ඩරයක් ටෙන්ඩර් ලියවිලි ගාස්තු ඉදිරිපත් කර නොතිබූ සැපයුම්කරුවකු වෙතද ප්‍රදානය කර තිබුණි. මෙම සැපයුම්කරුවන් ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචිවී නොමැති අය බවද නිරීක්ෂණය විය.

(ඉ) **ගල් විහාරය සඳහා පියස්සක් ඉදිකිරීම**

පොළොන්නරුව ගල් විහාරයේ විද්‍යාධර ලෙනට ඉහලින් පියස්සක් නිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ඉකුත් වර්ෂයේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවන ලද රු.1,458,870 ක්වූ සියයට 20 ක අත්තිකාරම් මුදල, සමාලෝචිත වර්ෂයේ සහතික කළ වැඩ වෙනුවෙන් කරන ලද රු.2,427,644 ක බිල්පත් නිරවුල් කිරීමේදී පියවාගෙන නොතිබූ අතර එම මුදල නොපියවූ අත්තිකාරම් ලෙස ගිණුම් වලට ඇතුලත් කර තිබුණි.

(ඊ) **අනුග්‍රාහක ආධාර ලබාදීම**

අනෙකුත් වියදම් යටතේ අනුග්‍රාහක ආධාර ලබාදීමේ කටයුතු වලදී පෙරහැර 8 ක් සඳහා විවිධ වට්ටෝරු ලෙස මුල්‍ය ආධාර ලෙස එකතුව රු.5,430,000 ක් ලබාදී තිබුණි. එහිදී ආධාර මුදල තීරණය කිරීමේ පදනම විගණනයට හෙළිදරව් නොවුණි.

(උ) **අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පත්වීම හා වැටුප් ගෙවීම**

(i) 2012 ඔක්තෝබර් 03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයක් පරිදි අරමුදලේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩ බැලීමේ පදනමින් එම තනතුරට පත්කර තිබුණේ අරමුදලේ බඳවා ගැනීම් පරිපාටිය අනුව ස්ථිර පදනමින් නිලධාරියකු පත්කරනු ලබන තෙක් වුවද මෙතෙක් ස්ථිර පදනමින් නිලධාරියකු පත්කර නොතිබුණි.

(ii) මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් වැඩ බැලීමේ වැටුපක් ගෙවිය යුතු වුවද එයට පටහැනිව පුරාවිද්‍යා මහාචාර්යවරයකු ලෙස නිත්‍ය තනතුරේ වැටුප අරමුදල මගින් ගෙවා තිබුණි. ඒ අනුව මාසිකව රු.162,706 බැගින් 2013 වර්ෂය සඳහා ගෙවූ වැටුප රු.1,952,468 කි. ස්ථිර පදනමින් මෙම තනතුරට නිලධාරියකු පත් කළේ නම් වැටුප මෙයට බොහෝ සෙයින් අඩුවන හෙයින් මෙම වැටුප් ගෙවීම අරමුදලට පාඩුවක් ලෙස නිරීක්ෂණය විය.

(vi) මෙම නිලධාරියාගේ නිත්‍ය තනතුරට අදාල වැටුප තුලට අයත් අධ්‍යාපනික දීමනා (Academic Allowance) සහ පර්යේෂණ දීමනාද (Research Allowance) වැ.බ.අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සිටිමින් දිගින් දිගටම අරමුදලින් ලබාගෙන තිබෙන අතර වැටුපට ඇතුලත්ව 2013 වර්ෂය තුලදී ලබාගත් එම දීමනා එකතුව රු.824,003 ක් විය.

(ඌ) **අනුරූ නිෂ්පාදනය හා අලෙවිය**

අරමුදල විසින් අනුරූ පාසැලක් පවත්වාගෙන යන අතර එහි අනුරූ නිෂ්පාදනය කරනු ලබන්නේ අලෙවිය සඳහා වේ. සමාලෝචිත වර්ෂය තුලදී පිරිවැය රු.4,280,060 ක්වූ අනුරූ නිෂ්පාදන හා නිෂ්පාදන ද්‍රව්‍ය අරමුණින් බැහැරව පරිත්‍යාග වශයෙන් විවිධ බාහිර ආයතන හා පුද්ගලයින් වෙත ලබාදී තිබූ අතර අනුරූ නිෂ්පාදන ගිණුමේ වර්ෂය තුල අලාභය රු.1,152,741 ක් විය.

(එ) <u>නීති නිලධාරී තනතුර සඳහා පත්කිරීම</u>

(i) මධ්‍යම සංස්කෘතික අරමුදලේ නීති නිලධාරි තනතුර සඳහා 2013 ජූනි 01 දින සි[illegible] නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම තරඟකාරී අයදුම්පත් කැඳවීමෙන් [illegible] හා පාලක මණ්ඩල ආවරණ අනුමැතියට යටත්ව සිදුකර තිබුණි. නීති නිලධාරී ත[illegible] සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව පැවතිය යුතු සුදුසුකම් ඔහුට නොතිබු[illegible] එසේ වුවද නීති නිලධාරි තනතුරට අදාල වැටුප් කාණ්ඩයේ ආරම්භක වැටුප සමග [illegible] අනුමත හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුමත වෙනත් දීමනා ද සමග වැටුප් ගෙ[illegible] අධ්‍යක්ෂ ජනරාල් විසින් නිර්දේශ කර 2014 ජූනි 01 වන විට ගෙවා තිබූ [illegible] රු.422,786 ක් විය.

(ii) 2014 මැයි 31 දිනෙන් සේවා කාලය අවසන් වන හෙයින් අයදුම්පත් කැඳවා සුදුසු අය[illegible] පත්කර ගන්නා තෙක් වසරක කාලයක් සඳහා පමණක් ඔහුගේ සේවය ලබාගැනීමට191.10.01 දරන පාලක මණ්ඩල තීරණය අනුව අනුමැතිය දී තිබුණද එය [illegible] පටහැනිව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ සේවා කාලය තවත් වසර 02 ක් සඳහා දීර්ඝ කරමින් 2014 ජූලි 03 දිනැති ලිපියක් නිකුත් කර පෙර පරිදිම වැටුප් ගෙවා තිබුණි.

කොන්ත්‍රාත් පදනම මත දෙනු ලබන පත්වීම් සඳහා රජයේ අනුමත අනෙකුත් දීමනා ලබාදිය නොහැකි වුවද අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි දීමනා තීරණය කර තිබුණි.

(ඒ) <u>වාහන මිලදීගැනීම</u>

මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා වාහන මිලදී ගැනීමේදී අනුමත වියදම් සීමාවන් පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක.BD/NI 177/2/9/01/CCF හා 2011 මාර්තු 25 දිනැති ලිපියෙන් දක්වා තිබුණි. ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහා අනුමත සීමාව රු. මිලියන 4.5 ක් වුවද එම සීමාව ඉක්මවා රු. මිලියන 2.48 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් කර තිබුණි. තවද අධ්‍යක්ෂ (මුදල්) හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ සඳහා වාහන 2 ක් මිලදී ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබියදී වාහන මිලදී ගෙන තිබූ අතර ඒ සඳහා රු. මිලියන 15.8 ක් වැය කර තිබුණි.

(ඔ) **පිරිවෙන්වල පුස්කොළ පොත් ලේඛන කලාව සංවර්ධනය කිරීම**

- පිරිවෙන්වල පුස්කොළ පොත් ලේඛන කලාව සංවර්ධනය කිරීමේ වැඩ සටහන වෙනුවෙන් පත්කළ පරිවෙනාචාර්යවරයකු 2011 සැප්තැම්බර් 01 සිට යාපහුව ව්‍යාපෘතිය වෙත අනුයුක්ත කර තිබූ අතර එම කටයුතු වලට අමතරව සංස්කෘතික හා කලා කටයුතු ඇමතිවරයාගේ සම්බන්ධීකරණ රාජකාරි කටයුතු වලද අරමුදලේ අරමුණු වලට පටහැනිව ඔහු යොදවා තිබුණි. මාසිකව රු.20,000 ක දීමනාවක් හා පෙට්‍රල් ලීටර් 100 ක් ලබාදී තිබුණද පුස්කොළ පොත් ලේඛන කලාව ප්‍රවර්ධනය සඳහා ඔහු ඉටුකළ රාජකාරි මොනවාද යන්න විගණනයට නිරීක්ෂණය නොවුනි.

4.5 **දෘශ්‍ය අකුම්කතා**

(අ) **විදේශීය සංචාරක ප්‍රවේශපත් සමග නොමිලේ ලබාදීම සඳහා DVD සපයා ගැනීම**

විදේශීය සංචාරක ප්‍රවේශපත් සමග නොමිලේ ලබාදීම සඳහා සීගිරිය, පොළොන්නරුව හා අනුරාධපුර යන සිද්ධස්ථාන ඇතුලත් DVD ලක්ෂ 5 ක් නිෂ්පාදනය කිරීම සඳහා අරමුදල විසින් 2013 වර්ෂයේදී ගිවිසුමකට ඇතුලත් වී ඒ සඳහා රු.51,099,925 ක් ගෙවා තිබුණි.

(i) අරමුදලේ අරමුණු හා පරමාර්ථ වලට පටහැනිව ක්‍රියා කරමින් අවශ්‍යතාවය පිළිබඳ අධ්‍යයනයක් හෝ ඇගයීමක් සිදුනොකර මේ සඳහා කොන්ත්‍රාත්තුවකට එළඹ තිබුණි.

(ii) පිරිවැය ඇස්තමේන්තු සැකසීම, පිරිවිතර සැකසීම හා ඒ අනුව ලංසු ලේඛන සැකසීම විශේෂ ප්‍රාගුණ්‍ය ඇති උපදේශකයකු විසින් සිදුකර නොතිබූ අතර ප්‍රසම්පාදන ලියවිලි විශේෂඥ දැනුම් ඇති තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් අනුමත කළයුතු වුවද එසේ කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරු විසින් නිපදවා භාරදෙන ලද DVD සුදුසුකම් ලත් තාක්ෂණික ඇගයීම් කමිටුවක පරීක්ෂාවට ලක්කර නොතිබුණි. මේ අනුව විනිවිදභාවයෙන් තොරව කටයුතු සිදුවී තිබුණි.

(iii) මෙම කොන්ත්‍රාත්කරු විසින් මෙම විෂයගත කරුණට අදාලවම මීට පෙර ලබාදුන් කොන්ත්‍රාතුවකට අදාල රු.4,701,000 ක ගිවිසුමක් කඩකර තිබියදී හා අදාල කාර්ය ඉටු කිරීමට පෙර vat බදු සමග සම්පූර්ණ මුදල වූ රු.5,191,150 ක් ගෙවා තිබියදී ඒ පිළිබඳ 2012 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ද කරුණු දක්වා තිබුණි. එම කරුණු නොසලකා හැර තිබුණි.

(iv) ගිවිසුමට එළඹීමේදී කොන්ත්‍රාත්කරුට වාසි සහගත වන පරිදි කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත්තුවේ පාඩු ආවරණ ප්‍රතිශතය (රඳවා තබා ගැනීමේ මුදල්) ඇතුලත් නොකිරීම, ප්‍රමාද ගාස්තු ඇතුලත් නොකිරීම, Vat බදු අරමුදල මගින් ගෙවන බව දැන්වීම යන දෝෂ සහගත තත්ත්වයන් ගිවිසුමේ විය.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (අ ) සහ 5.4.10 (ඇ) ප්‍රකාරව ලංසු සුරක්ෂණ සහ කාර්ය සාධන සුරක්ෂණ ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමින් 1 % ක් සහ 10 % ක් ලෙස ලබාගත යුතු වුවද ඊට අඩු වටිනාකම් වලින් ලබාගෙන තිබුණි. ඒ අනුව රු.446,250 ක් හා රු.2,281,250 ක් අඩුවෙන් එම සුරක්ෂණ ලබාගෙන තිබුණි.

(vii) වාර්ෂික ප්‍රවේශපත්‍ර අවශ්‍යතාවය වන ලක්ෂ 5 කට සමානව DVD ලක්ෂ 5 ක් එකවර නිෂ්පාදනය කර තිබීමෙන් වර්ෂයක් වැනි කාලයක් ඒවා ගබඩාකර තැබීමේදී ඇතිවිය හැකි ආසාදිත තත්ත්වයන් සඳහා කොන්ත්‍රාත්කරු වෙතින් සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

(viii) DVD නිෂ්පාදනය සඳහා ඉදිරිපත් වූ අවම ලංසුව නොසලකා හැර උපරිම ලංසුව තෝරාගෙන තිබීමෙන් එක් DVD තැටියකට රු.36.25 බැගින් DVD ලක්ෂ 5 ක් නිපදවීමේදී මධ්‍යම සංස්කෘතික අරමුදලට රු.18,125,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(ix) මෙම කොන්ත්‍රාත්කරු එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. නමුත් ව්‍යාජ බදු අංකයක් ඔහුගේ ඉන්වොයිස් පත්වල ඇතුලත් කර තිබූ අතර ඒ අනුව මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතින් වංචා සහගතව වැට් බදු ලෙස රු.5,474,999 ක් අයකරගෙන තිබුණි.

(x) මෙම කොන්ත්‍රාත්කරු මගින් පෙර නිෂ්පාදනය කරගත් අනුරාධපුර, පොළොන්නරුව හා සීගිරිය ඇතුලත් වාර්තාමය චිත්‍රපට වල ඇතුලත් දර්ශන පරිගණක පිටපත් කිරීමක් තුලින් යලි සකසා මෙම DVD පට සඳහා යොදා වංචා සහගත ලෙස ඉදිරිපත් කර තිබෙන බව විගණනයේදී තහවුරු වූයෙන් අරමුදලට මෙයින් සිදුවූ පාඩුව දළ වශයෙන් රු.මිලියන 40 කට වැඩි බව නිරීක්ෂණය කෙරේ.

(ආ ) **ක්‍රියාකාරි අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීම හා දීමනා ගෙවීම**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් නොවන හා මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ හෝ නොදැක්වෙන ක්‍රියාකාරි අධ්‍යක්ෂ නම් තනතුරකට නිලධාරියකු 2006 වර්ෂයේ ජනවාරි සිට පත්කිරීම පාලක මණ්ඩලය විසින් අනුමත කර අරමුදලේ නිත්‍ය කාර්ය මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුට හිමි වැටුප් ක්‍රමයේ උපරිම වැටුප් තලයට එක් වැටුප් වර්ධකයක් අඩුවෙන් වන දීමනාවක් එම වර්ෂයේ සිට ගෙවා තිබුණි. 2006 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා එසේ ගෙවූ දීමනාවේ එකතුව රු. 4,494,105 ක් විය.

(i) පාලක මණ්ඩලය විසින් මෙලෙස දීමනා අනුමත කළ නොහැකි බවත්, ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු බවත් 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මගින් දක්වා තිබුණද එම උපදෙස් අනුගමනය කර නොතිබුණි.

(ii) මෙම නිලධාරියා වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරක ස්ථිර සේවයේ නිලධාරියකු වන අතර උක්ත කාල සීමාව තුල එහි සේවයේ යෙදෙමින් එම ආයතනයෙන්ද සම්පූර්ණ වැටුප් හා දීමනා ලෙස රු.5,076,836 ක් ලබාගෙන තිබුණි.

තවද මධ්‍යම සංස්කෘතික අරමුදලේ ස්ථිර සේවයේ අධ්‍යක්ෂ තනතුරකට හිමි සියලු වරප්‍රසාද ලබාගෙන තිබූ අතර රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවක වැටුප් වැඩිවීම් වලදී දීමනාව ඒ අයුරින් වැඩිකරගෙන හිඟ මුදල් ද සමග ලබාගෙන තිබුණි.

(iii) 2006 සිට 2013 දක්වා කාලය තුල මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාහන 2 ක් අනුයුක්ත වාහන ලෙස වරින් වර භාවිතා කර තිබූ අතර මාසිකව ලීටර් 120 බැගින් ඉන්ධන දීමනාවද ලබාගෙන තිබුණි. එම සම්පූර්ණ කාලයට ලබාගත් ඉන්ධන දීමනාව රු.949,618 කි. එම කාලය තුල වෘත්තීය පුහුණු අධිකාරිය වෙතින්ද අනුයුක්ත වාහනයක් හා 2013 සඳහා මාසිකව ඉන්ධන ලීටර් 140 බැගින් හා ඊට පෙර වර්ෂ සඳහා ලීටර් 120 බැගින් ලබාගෙන තිබුණි. 2013 වර්ෂය තුල එම ආයතනයෙන් ලබාගෙන තිබූ සම්පූර්ණ ඉන්ධන දීමනාව රු.193,200 කි. ඇතැම් දිනවල මෙම නිලධාරියා ආයතන දෙකෙන් ලබාගත් වාහන දෙකම එකම දිනවල භාවිතා කර තිබුණි.

2013 වර්ෂය තුලදී මෙම නිලධාරියා වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් මිලදීගත් වාහනයේ වටිනාකම රු.මිලියන 7.9 ක් විය. මේ අනුව ආයතන 2 කින් වැටුප්/ දීමනා, ඉන්ධන හා නිල වාහන භාවිතා කරමින් රාජ්‍ය සම්පත් අයථා පරිහරණයට යොදවා තිබුණි.

(ඇ) <u>බොරළු මිලදී ගැනීම - සීගිරිය ව්‍යාපෘතිය</u>

(i) සීගිරිය ව්‍යාපෘතියේ අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියාවට බොරළු මිලදී ගැනීමේදී, 2013 වර්ෂයේ මාතලේ දිස්ත්‍රික් මිල කමිටු මිල ගණන් අනුව බොරළු කියුබ් 1 ක මිල රු.1,000 ක් වුවද කියුබ් 1 ක් රු.1,875 බැගින් බොරළු කියුබ් 383 ක්ද, කියුබ් 1 ක් රු.2,000 බැගින් කියුබ් 500 ක්ද මිලදීගෙන තිබූ අතර ප්‍රදේශයේ පවතින මිල ගණන් ඉක්මවා බොරළු මිලදී ගැනීම හේතුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලට රු.835,125 ක අලාභයක් සිදුකර තිබුණි.

(ii) 2013 වර්ෂයේදී බොරළු කියුබ් 883 ක් මිලදී ගැනීම සඳහා ඇනවුම් කර ගෙවීම් කර ඇතත් ගබඩා භාරකරු විසින් පවත්වාගෙන ගොස් තිබූ තොග පොත අනුව වර්ෂය තුල ලැබී තිබූ බොරළු ප්‍රමාණය කියුබ් 681.5 ක් විය. මේ අනුව ගබඩාවට සපයා නොතිබූ බොරළු කියුබ් 201.5 ක් සඳහා රු.380,230 ක් සාවද්‍ය ලෙස ගෙවීම් කර තිබුණි.

(iii) 2013 වර්ෂය තුලදී මිලදීගත් රු.253,950 ක් වටිනා බොරළු කියුබ් 135.44 ක ප්‍රමාණයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 1 ½ ක පමණ කාලයක් අනාරක්ෂිතව ගබඩා පරිශ්‍රය තුල ගොඩගසා තිබෙන බව 2014 සැප්තැම්බර් 22 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද එම බොරළු ටෙන්ඩර් පිරිවිතර වල සඳහන් නියමිත ප්‍රමිතියට නොතිබුණි.

(ඈ) <u>අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාහන පරිහරණය</u>

(i) අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුයුක්ත කර ඇති අංක. WPKS – 1164 නිල රථයේ ධාවනය නොකළ කිලෝමීටර් 5929 ක් සඳහා ධාවනය කළ බවට ව්‍යාජ සටහන් තබමින් ධාවන සටහන් පත්වල සාවද්‍ය ගණන් පෙන්වා රු.137,214 ක් වටිනා ඉන්ධන ලීටර් 847 ක් වංචනික ලෙස ලබාගෙන තිබුණි. 2014 අගෝස්තු 22 දිනට වාහනයේ මයිලෝ මීටරය කි.මී.111,476 ක් වුවද ධාවන සටහන් පත්වල කි.මී.117,405 ක් ධාවනය කර ඇති බව දැක්වීමෙන් ධාවනය කර ඇති බව සටහන් කර තිබූ වැඩිපුර දුර ප්‍රමාණය කි.මී.5929 ක් විය.

(ii) තවද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වෙන්කර ඇති ඉහත නිල රථය ඔහු විදේශගතව සිටි, 2013 ජනවාරි 07 සිට 20 දක්වා, මැයි 23 සිට 28 දක්වා, ඔක්තෝබර් 01 සිට 07 දක්වා සහ ඔක්තෝබර් 27 සිට 31 දක්වා කාලය තුල ධාවනයේ යොදවා ඔහුගේ භාර්යාවගේ පරිහරණයට ගෙන තිබුණි. එම කාලයට අදාලව ධාවන සටහන් වල අධ්‍යක්ෂ ජනරාල්වරයා අත්සන් කිරීමද සිදුකර තිබූ අතර එම කාලය තුල කි.මී. 1795 ක් ධාවනයේ යොදවා ලීටර් 297 ක් ඉන්ධන භාවිතයට ගෙන තිබුණි.

4.6 <u>අනාර්ථික ගනුදෙනු</u>

2013 – 2016 කාල පරිච්ඡේදය සඳහා රු.600,000 ක්වූ කොන්ත්‍රාත් මිලක් හා ඊට අමතරව නිලධාරීන් පුහුණුව සඳහා තවත් රු.142,528 ක්ද වැය කරමින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද ඊට අනුගත වන පරිදි ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 වන විටත් පිළියෙල කර නොතිබුණි. සංයුක්ත සැලැස්ම ආයතන වෙත ලැබී තිබුණේ 2014 මැයි 13 දින වන අතර ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේද සංශෝධනයන්ට යටත්වය. මේ අනුව මෙම කාර්යය විධිමත් පරිදි ඉටුවී නොතිබූ අතර ඒ සඳහා වැයකළ රු.742,528 ක්වූ මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

4.7 <u>අරමුණට පටහැනි වියදම්</u>

අරමුදලේ අරමුණු වලට පටහැනි පහත සඳහන් වියදම් සමාලෝචිත වර්ෂය තුලදී දරා තිබුණි.

(අ) ජනපති පදවි ප්‍රාප්තිය 2 වන සැමරුම වෙනුවෙන් සුභ පැතීම සඳහා පුවත්පත් දැන්වීම් ගාස්තු ලෙස රු.351,000 ක් ගෙවීම.

(ආ) තායිලන්ත දූත පිරිසක් ලංකාවට පැමිණීම වෙනුවෙන් වියදම් දැරීම සඳහා සංස්කෘතික අමාත්‍යාංශය වෙත රු.1,000,000 ක් ලබාදීම.

(ඇ) රාජකීය ආසියාතික සමිතිය නමින් වූ බාහිර පුද්ගලික ආයතනයක් විසින් සංවිධානය කළ ශාස්ත්‍රීය සම්මේලනය සඳහා අනුග්‍රාහක දීමනාවක් ලෙස අරමුදල විසින් රු.400,000 ක් ගෙවා තිබුණි.

(ඈ) 2013 මැයි 01 ලෝක කම්කරු දිනය සැමරීම වෙනුවෙන් සේවකයින්ට බෙදාදීම සඳහා ටී ෂර්ට් 1200 ක් රු.720,000 ක් ගෙවා මිලදී ගෙන තිබුණි.

4.8 <u>හඳුනාගන්නා ලද පාඩු</u>

(අ) අදාල ආයතන විසින් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම මත අත්තිකාරම් බැඳුම්කර හා කාර්ය සාධන බැඳුම්කර අවලංගුවීමට ප්‍රථම එම මුදල් අයකර ගැනීමට අරමුදල කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් 2000 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත ගෙවන ලද රු.325,000 ක් හා 2001 වර්ෂයේදී තවත් පුද්ගලික සමාගමක් වෙත ගෙවන ලද රු.1,382,055 ක් එම වර්ෂ වල සිට නොපියවන ලද අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබුණි.

රු.1,382,055 ක මුදල අයකර ගැනීම සඳහා එම සමාගමට එරෙහිව අරමුදල විසින් පවරා තිබූ නඩුවෙහි 2011 ජුනි 30 දිනැති තීන්දුව ප්‍රකාරව රු.4,472,150 ක් අරමුදල වෙත ගෙවන ලෙස සමාගමට නියෝග කර තිබුණද 2013 දෙසැම්බර් 31 වන විටත් එය අයකර ගැනීමට නොහැකිව තිබුණි.

4.9 <u>වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදුන් අරමුදලේ සම්පත්</u>

(අ) 1997 ජනවාරි 24 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 116 අනුව රාජ්‍ය ව්‍යාවසායකයන්ගේ මූල්‍ය සම්පත් ඇතුළු අනෙකුත් සම්පත් අධීක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා ලබා නොදිය යුතුය. නමුත් 1989 , 2000, 2001 සහ 2011 යන වර්ෂ වල සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ සේවයට මුදාහැර තිබුණු මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 07 දෙනෙකු 2013 වර්ෂයේදී ද අමාත්‍යාංශ සේවයේ යොදවා තිබූ අතර ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් ඔවුන් සඳහා අරමුදල විසින් ගෙවා තිබූ දල වැටුප් එකතුව රු.2,286,205 ක් විය.

(ආ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ 2013 වර්ෂයේදී වැඩ බැලීම සිදුකරන ලද සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරයා වෙත අරමුදල මගින් 2013 පෙබරවාරි 15 දින ලබාදී තිබූ රු.110,847 ක් වටිනා නෝට් බුක් පරිගණකය ඔහු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ 2013 සැප්තැම්බර් 03 දින සිට ස්ථාන මාරුවී යාමේදී ආපසු ලබාගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. 2014 අගෝස්තු 25 දින වන විටත් එය ආපසු ලබාගෙන නොතිබුණි.

(ඇ) මධ්‍යම සංස්කෘතික අරමුදල සතු අංක. WPPE – 0771 දරන ඩබල් කැබ් රථය 2013 මැයි සිට සැප්තැම්බර් දක්වා සම්පූර්ණ කාලය තුල ආයතනයේ රාජකාරි වලින් බැහැරව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ පරිහරණය සඳහා යොදවාගෙන තිබුණි. එම කාලයට අදාල දෛනික ධාවන සටහන් පත් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

4.10 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

(අ) අරමුදලේ ප්‍රධාන තනතුරු 85 ක් හා වෙනත් තනතුරු බොහොමයක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් තනතුරු වල රාජකාරී ආවරණය කර ගැනීම සඳහා වැඩ බැලීමේ/ රාජකාරී ඉටු කිරීමේ පදනම මත නිලධාරීන් සේවයේ යෙදවීමට සිදුවී තිබුණි. සංශෝධිත කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කරවා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(i) 2013 දෙසැම්බර් 31 වනවිට වැඩබැලීමේ/ රාජකාරී ඉටුකිරීමේ පදනම මත සේවයේ යොදවා සිටි නිලධාරීන් සංඛ්‍යාව 77 කි. ඒ සඳහා 2013 වර්ෂයේදී ගෙවා තිබූ වැඩ බැලීමේ/ රාජකාරී ඉටුකිරීමේ දීමනාවල එකතුව රු.2,332,515 ක් විය.

(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය මගින් පුරප්පාඩු තනතුරු වල නිත්‍ය පත්කිරීම නොපමාව සිදුකළ යුතු බව දන්වා ඇතත් ඉන් බැහැරව කටයුතු කරමින් අරමුදල විසින් පුරප්පාඩු තනතුරු සඳහා දිගින් දිගටම වැඩ බැලීමේ/ රාජකාරී ඉටු කිරීමේ පදනම මත නිලධාරීන් සේවයේ යොදවා තිබුණි. 2013 දෙසැම්බර් 31 වන විට අවුරුදු 1 සිට 6 දක්වා කාලයක් එසේ රාජකාරී කරමින් සිටි නිලධාරීන් සංඛ්‍යාව 32 ක් විය.

(iii) 2013 මාර්තු 01 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී 09 වන කාරණය යටතේ මේ පිළිබඳව අවධාරණය කර තිබූ අතර ගණන්දීමේ නිලධාරී ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කර සිටියේ මාසයක් ඇතුලත එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව වුවද ඒ සඳහා ක්‍රියාත්මක කාර්ය භාරයක් මෙතෙක් ඉටුකර නොතිබුණි.

(iv) 2011 දෙසැම්බර් 02 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු තනතුරු වෙනුවෙන් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු වුවත් මෙතෙක් කිසිදු කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් පවත්වා නොතිබුණි.

(ආ) පාලක මණ්ඩලයේ අනුමැතිය මත තාවකාලික පදනමින් ඇතැම් නිලධාරීන් බඳවාගෙන තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබානොතිබුණි.

| තනතුර | පත්කළ දිනය | තනතුරු සංඛ්‍යාව | මාසික දීමනාව |
|---|---|---|---|
| | | | රු. |
| කැණීම්/සංරක්ෂණ පරීක්ෂක | 2013.06.17 සහ 2013.11.04 | 02 | 45,000 |
| ආරක්ෂක නියාමක | 2013.06.02 | 48 | 20,000 |

(ඇ) අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 2013 වර්ෂයේදී බඳවාගෙන තිබුණි. ආරක්ෂක උපදේශක ලෙස තනතුරු 1 ක්ද, ආරක්ෂක විශේෂ විභිදුම් හා විමර්ශන නිලධාරී ලෙස තනතුරු 4 ක්ද සඳහා බඳවාගෙන පාලක මණ්ඩල අනුමැතිය මත මාසිකව රු.30,000 ක් හා රු.25,000 ක් බැගින් දීමනා ගෙවා තිබූ අතර එසේ බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 4.11 වාහන උපයෝජනය

(අ) (i) ආයතනයේ අවශ්‍යතාවය සඳහා 2013 වර්ෂය තුලදී කුලී පදනම මත වෑන් රථ 4 ක් ලබාගෙන තිබූ අතර ඒ සඳහා මිල ගණන් කැඳවීම හා සැපයුම්කරුවන් තෝරා ගැනීම කිසිදු විනිවිදභාවයකින් තොරව සිදුවී තිබුණි. 2004 අගෝස්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 353 (5) හි 2 ඡේදයේ උපදෙස් වලට පටහැනිව එම වාහන 3 ක් සඳහා මාසික කුලිය රු.50,000 හා 45,000 වශයෙන් ගෙවා තිබූ අතර වාහන සැපයුම්කරුවන් සමග කිසිදු ලිඛිත ගිවිසුමකටද එළඹී නොතිබුණි.

(ii) ඉහත වාහන 3 අතුරින් එක් වාහනයක මාසික කුලිය රු.50,000 ක් වේ. 2013 වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා මාස 6 ක කාල සීමාව තුල මාසික අනුමත සීමාව වූ රු.40,000 ඉක්මවා ධාවනයේ යෙදවීම වෙනුවෙන් එකතුව රු.306,275 ක් කුලිය වශයෙන් ගෙවා තිබුණි. තවද එම ආයතනයේ හිමිකරු විසින් ඉටු කළයුතු සේවා හා ටයර් දැමීම ආදිය මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් සිදුකර තිබුණි.

(ආ) අනුයුක්ත වාහන භාවිතා කරන නිලධාරීන් විසින් තම විශේෂ රාජකාරි සඳහා අමතර ඉන්ධන ලබාගැනීම සිදු කරන්නේ නම් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු නමුත් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2013 වර්ෂය තුලදී, ක්‍රියාකාරී අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ (පාලන) විසින් අමතර ඉන්ධන පිළිවෙලින් ලීටර් 2180 හා 4004 වශයෙන් ලබාගෙන තිබුණි. ඒ සඳහා අරමුදල විසින් පිළිවෙලින් රු. 263,780 ක් හා 484,484 ක් වැයකර තිබුණි.

05. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

5.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශන සඳහා පාලක මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා නොතිබුණි. පාලක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන වල වගකීම භාරගෙන ඒවා අනුමත කළයුතු වුවද විගණනයට ඉදිරිපත් කිරීමට පෙර පාලක මණ්ඩල අනුමැතිය ලබා නොතිබුණි.

5.2 <u>සංයුක්ත සැලැස්ම</u>

ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහාත් අරමුණු කරා ළඟාවීම සඳහාත් හැකිවන පරිදි වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් වර්ෂය ආරම්භ වීමට පෙර පිළියෙල කර නොතිබුණි. 2013 මැයි මාසයේදී සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද පාලක මණ්ඩලය විසින් එය අනුමත කර තිබුණේ සංශෝධනයන්ට යටත්වය.

5.3 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

සංයුක්ත සැලැස්මට සමගාමී වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. අරමුදල විසින් එහි එක් එක් ව්‍යාපෘතිවල ඉටුකරනු ලබන කැණීම් හා සංරක්ෂණ වලට අදාල වැඩ සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම ලෙස ඉදිරිපත් කර තිබුණි. සමස්ත ආයතනයේම ක්‍රියාකාරීත්වය ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.4 <u>අයවැය ලේඛනමය පාලනය</u>

(අ) 2013 වර්ෂය සඳහා පිළියෙල කරන ලද සංශෝධිත අයවැය ලේඛනය පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2013 දෙසැම්බර් මස 03 දිනදීය. ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ 2013 දෙසැම්බර් 23 දින වේ. 2013 වර්ෂයේ වියදම් දැරීම පාලනයකින් තොරව සිදුකර වර්ෂය අවසානයේ වියදමට සරිලන ලෙස සංශෝධිත අයවැය ඇස්තමේන්තුවක් සකස් කර ඊට පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබෙන බව මේ අනුව නිරීක්ෂණය විය.